2021
ජනවාරි



# පෙර දැක්ම 2021

2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# පෙර දැක්ම 2021:
# 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

**ඉදිරිපත් කිරීම**

**දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්**

**අධිපති**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 ජනවාරි 04**

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වසරේ පෙර දැක්ම ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා මම ඔබ සැම දෙන සාදරයෙන් පිළිගනිමි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පෙර දැක්ම-2021 ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටට කරුණකි.

මා මේ සිදු කරන්නේ 2007 වසරේ දී ආරම්භ වූ සම්ප්‍රදායක් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමකි. මෙම පෙර දැක්ම ප්‍රකාශය මගින් 2021 සහ ඉදිරියට වසර කිහිපයක් ආවරණය කෙරේ. මවිසින් පැහැදිලි කරනු ලබන්නේ ඉහත සඳහන් කළ කාලපරිච්ඡේදය තුළ දී ක්‍රියාවට නැංවෙන මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්තිවල පුළුල් දිශානතිය යි. අවාසනාවකට, පවත්නා තත්ත්වය හේතුවෙන්, මෙම ප්‍රකාශය අථත්‍ය ආකෘතියෙන් ඉදිරිපත් කිරීමට මට සිදු වී ඇත. කොවිඩ්-19 වසංගතය විසින් සමාජ, ආර්ථික හා ආයතන ක්‍රියාත්මක වන ආකාරය, සිතාගත නොහැකි අන්දමට සම්පූර්ණයෙන්ම වෙනස් කර ඇත.

2020 වසර අප බොහෝ දෙනෙකු හැකි ඉක්මනින් අමතක කර දැමීමට කැමති වසරක් වනුයේ ප්‍රධාන වශයෙන් කොරෝනා වසංගතය මගින් ලොව පුරා මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි ඇති කරන ලද භයානක බලපෑම් හේතුවෙනි. අප දැනට අත්දකින මෙම කොවිඩ්-19 වසංගතය දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ අන් සෑම අභියෝගයකටම වඩා දරුණුතම ගෝලීය අර්බුදය යි. පසුගිය මාස දහයක පමණ කාලය තුළ අපට අසන්නට ලැබුණේ ඛේදවාචක, මරණ හා බිය ගෙනෙන තොරතුරු ය. අප ජීවිතවලට අතිමහත් කම්පන ගෙන දුන් අවස්ථා තිබූ අතර, නැවත සාමාන්‍ය තත්ත්වයට පැමිණීමට තවත් කොපමණ කලක් ගත වේදැයි අපි නොදනිමු. කෙසේ වෙතත්, අපට නව වසරක් උදා වී ඇති අතර, තත්ත්වය තරමක් ඉක්මනින් යහපත් අතට හැරෙනු ඇති බවට අපේක්ෂා මෙන්ම සැබෑ සාධක ද පෙනෙන්නට ඇත. 2020 වසරේ අප්‍රසන්න සිහිවටන පසෙක ලා ඉදිරියට යන අප, අනාගතය පිළිබඳව ධනාත්මකව සිතිය යුතු අතර, ඛේදවාචක පිළිබඳ අනාවැකි පළකරන්නන් කුමක් කීව ද සුභදායක හා අපේක්ෂා සහගත බවක් අප වටා ජනිත කිරීම වැදගත් ය.

ලෝකයේ අනෙකුත් බොහෝ ආර්ථිකයන් මෙන්ම, විශේෂයෙන්ම මෙරට වසංගතය මතු වූ පළමු රැල්ලේ දී එය පැතිරීම මැඩ පැවැත්වීමට පැනවූ සංචරණ සීමා හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය ද දැඩි බලපෑමට ලක් විය. පුද්ගලයන්, පවුල් සහ ව්‍යාපාරවලට මහා පරිමාණයෙන් උපකාර කිරීමට රජයට සහ මහ බැංකුවට කඩිනමින් පියවර ගැනීමට සිදු විය. මුදල් තත්ත්වය ලිහිල් කිරීමට සහ ණය පොලී අනුපාතික අඩු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව පෙර නොවූ විරූ ක්‍රියාමාර්ග හඳුන්වා දුන්නේය. මේ අතර, බදු අඩු කිරීම, ඉලක්කගත සහනාධාර හා සංක්‍රාම වැනි නොයෙකුත් ක්‍රියාමාර්ග හරහා රජය සැලකිය යුතු මට්ටමේ රාජ්‍ය මූල්‍ය සානුබල හඳුන්වා දුන්නේය. සමාජ දුරස්ථකරණය පවත්වා ගැනීමේ ක්‍රියාමාර්ග හේතු කොටගෙන ආර්ථික කටයුතු අඩාල වූ අතර, ඒ හේතුවෙන් රජයේ ආදායම සැලකිය යුතු ලෙස පහළ ගියේ ය. මෙය සිදු වූයේ, රාජ්‍ය වියදම්, විශේෂයෙන්ම වසංගතය හා සබැඳි වියදම්, ඉහළ ගිය පසුබිමක් තුළ ය. ඒ නිසා ඉහළ ගිය රජයේ ආදායම්-වියදම් පරතරය මූල්‍යනය කිරීම සඳහා මහ බැංකුව මූලික වශයෙන් ක්‍රියා කළේය. විශාල ණය සේවා ගෙවීම් ඇතුළුව ආර්ථිකය මුහුණ දී ඇති අභියෝගවලට මුහුණ දීමට නිශ්චිත උපාය මාර්ග ද සහිතව, 2021 වසර සඳහා වූ අයවැය ඔස්සේ නවමු ප්‍රවේශයක් රජය විසින් ඉදිරිපත් කරන ලදී. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන මෙරට ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ හෙළූ නමුත්, රජය සිය වියදම් ක්‍රියාවලිය පවත්වාගෙන ගිය අතර ම සිය ණය වගකීම් නිසි කලට පියවමින්, ඉදිරියේදීත් එලෙසම සිදු කරන බවට විශ්වාසයෙන් යුතුව ප්‍රතිඥා ලබා දුන්නේ ය. මහ බැංකුව විසින් ගෙවුම් තුලනයට බලපෑ හැකි මෑත කාලීන අභියෝග පූර්වෝපායිකව විසඳීමට උපරිම ප්‍රමුඛත්වය ලබා දී ඇත. ඉදිරි කාල සීමාව තුළ දී රටේ විදෙස් ණය වගකීම් සාර්ථකව පියැවීම සහතික කිරීම අරමුණු කරගනිමින් රජයේ විදේශ ණය කළමනාකරණය කර ඇත.

ආර්ථිකයේ දිගු කාලීනව පවත්නා සමහර ව්‍යුහාත්මක දුර්වලතාවලට පිළියම් යෙදීමට අවස්ථාවන් ද කොවිඩ්-19 වසංගතය මගින් උදා කර දී ඇත. එවැනි ව්‍යුහාත්මක දුබලතා කිහිපයක් නම්, දේශීය නිෂ්පාදනය බොහෝ දුරට නොසලකා හැරීම, නිෂ්පාදන හා වෙළෙඳපොලවල් සීමිත ප්‍රමාණයක් මත අපනයන අධික ලෙස කේන්ද්‍රගත වීම, ආනයන මත බොහෝ දුරට රඳා පවතින පරිභෝජනය සහ

නිෂ්පාදනය, දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කණ්ඩායම් පැවතීම සහ ආර්ථික වශයෙන් අවදානමට ලක් වූ ජන කොටස් සිටීම, 'ද්විත්ව හිඟය' ලෙස හඳුන්වන විදේශ ජංගම ගිණුමේ මෙන්ම රජයේ අයවැයෙහි ද එකවර හිඟ තත්ත්වයක් පැවතීම සහ විදේශ ණය මත දැඩි ලෙස රඳා පැවතීම යි. 2021 අයවැය මගින් අපේක්ෂා කරන්නේ දේශීය මෙන්ම විදේශීය ආයෝජන හරහා නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීමට ගන්නා පියවර සහ විවෘත විදේශ වෙළෙඳාම පිළිබඳව වඩාත් තාර්කික දැක්මක් ද මගින් මූර්ත ආර්ථිකයේ පුනර්ජීවනයක් ඇති කිරීම යි. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ඒ හා සම්බන්ධ ඉහළ අගය දාම කටයුතුවලට ලැබුණු සහාය අතිමහත් ය. මේ පියවර සියල්ල එක්ව ගත කළ, මැදි කාලීනව සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ස්වාරක්ෂක ගොඩනැගීම සඳහා එමගින් රටට පිටිවහලක් ලබා දෙනු ඇත.

**මෙම පසුබිම යටතේ, 2020 වසර තුළ ආර්ථික කාර්ය සාධනය පිළිබඳ කෙටි ඇගයීමක් සමඟ 2021 වසරේ පෙර දැක්ම ඉදිරිපත් කිරීම ආරම්භ කරමි.**

අප්‍රේල් සිට මාර්තු දක්වා කාලය තුළ දී පනවන ලද සංචරණ සීමා නිසා මතු වූ අවහිරතා හේතුවෙන්, දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම ආරම්භ කළ දින සිට මේ දක්වා වාර්තා වූ විශාලතම ආර්ථික පසුබෑමට 2020 වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකාව මුහුණ දුන්නේ ය. මෙම සීමා පැනවීම්හි ප්‍රතිඵලයක් ලෙස, ජනතාවගෙන් සැලකියයුතු කොටසකට, විශේෂයෙන් ම ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට, දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. අනෙකුත් සමහර අංශයන්ට සිය සේවා ස්ථානවල පරිසරය සඳහා නව්‍ය වෙනස්කම් හඳුන්වාදීමට සිදු වූ අතර, ඔවුන්ගේ මෙහෙයුම් පවත්වාගෙන යෑම සඳහා ඩිජිටල් මාධ්‍ය යොදා ගැනීම සුලභව සිදු විය. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස ආර්ථික කටයුතුවල ප්‍රගතිය මැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු දුෂ්කරතා ද මතු වූ අතර, එමගින් අවධාරණය කෙරෙන්නේ වෙනස්වන ආර්ථික තත්ත්ව ග්‍රහණය කර ගැනීම සඳහා එම ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය යි. ආහාර උද්ධමනයේ යම් ඉහළ යෑමක් සිදු වුව ද, විභව මට්ටමට වඩා අඩු වූ ආර්ථික වර්ධනය මධ්‍යයේ මතුපිට

උද්ධමනය පහළ අගයක පැවැතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද.) පදනම් කර ගත් මතුපිට උද්ධමනය, දැනට ක්‍රියාත්මක වන උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ ඉලක්කගත පරාසය වන, සියයට 4ත් - 6ත් අතර වසර පුරා රැඳී තිබුණි. මේ අතර, ඉල්ලුමෙන් ඇතිවන උද්ධමන පීඩනය පහළ මට්ටමක පවතින බව පිළිබිඹු කරමින් මූලික උද්ධමනය අඩු මට්ටමක පැවතුණි. සිව්වන කාර්තුව තුළ දී කොවිඩ් -19 දෙවන රැල්ලෙන් නැවත වරක් බලපෑමට ලක්වීමට පෙරාතුව, තෙවන කාර්තුව තුළ දී, විශේෂයෙන් ම ඊට පෙර කාර්තුව හා සැසඳීමේ දී, ආර්ථිකය සැලකිය යුතු යහපත් වර්ධනයක් වාර්තා කළේ ය.

පීඩාවට පත් වූ ආර්ථිකයට සහාය සපයමින් මුදල් ප්‍රතිපත්තිය පෙර නොවූ විරූ මට්ටමට ලිහිල් කිරීම සඳහා අඩු මට්ටමේ පැවති උද්ධමනය සහ ඉලක්කගත පරාසය තුළ මනාව පාලනය කරන ලද උද්ධමන අපේක්ෂා තුළින් මහ බැංකුවට ඉඩ ප්‍රස්තා සැලසුණි. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කඩිනම් කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථා සංචිත අනුපාතය ඉතිහාසයේ මෙතෙක් පැවති පහළ ම මට්ටම දක්වා අඩු කර සහනදායී පොලී අනුපාතික යටතේ විශේෂ ණය යෝජනා ක්‍රම අරඹන අතර ම, තෝරාගත් ණය උපකරණ මත පොලී අනුපාතික සඳහා උපරිම සීමාවන් හඳුන්වා දීම ද සිදු කරන ලදී. තවද, රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ තුළින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සිදු කළේ ය. මේ අතර, පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය තවදුරටත් ඉහළ නැංවීමේ අරමුණ ඇතිව දේශීය මුදල් වෙළෙඳපොල තුළ ඉහළ මට්ටමේ අතිරික්ත ද්‍රවශීලතාවක් රඳවා ගැනීම සඳහා මහ බැංකුව විසින් ඉඩ ප්‍රස්ථා සැලසීය. මෙම සැලකිය යුතු මට්ටමේ මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණ ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොල පොලී අනුපාතික විශාල ලෙස පහළ ගිය අතර, පදනම් පොලී අනුපාතික බොහොමයක් ඉතිහාසයේ පැවති අවම මට්ටම් දක්වා පහත වැටුණි. ඉලක්කම් දෙකක මට්ටමේ පැවති බොහෝ වෙළෙඳපොල ණය පොලී අනුපාතික විශාල ලෙස පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස නව ණය අනුපාතිකවල සාමාන්‍යය තනි ඉලක්කමක මට්ටම් දක්වා අඩු වූ අතර, එමගින් දශකයකට අධික කාලයක් පුරා උද්ධමනය තනි අගයක මට්ටමේ පවත්වාගෙන යෑමේ පූර්ණ ප්‍රතිලාභය අත්කර

ගැනීමට ආර්ථිකයට හැකියාව ලැබිණි. මෑත මාසවලදී පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණයෙහි ක්‍රමානුකූල ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, රාජ්‍ය අංශය සඳහා ලබාදුන් ණය අසාමාන්‍ය ඉහළ යෑමක් වාර්තා කිරීමත් සමඟ, වසංගතය හේතුවෙන් ආර්ථිකයේ ඇති වූ පසුබෑම මධ්‍යයේ, ව්‍යාපාර චක්‍රයේ පසුබෑමට ප්‍රතිවිරුද්ධ ප්‍රවණතාවක් නිරූපණය කරමින් 2020 වසර තුළදී මුදල් සැපයුම සැලකිය යුතු ලෙස ඉහළ ගියේ ය.

වර්තමානයේ පවතින අඩු පොලී අනුපාතික ව්‍යුහය හේතුවෙන්, විශේෂයෙන් ම සිය තැන්පතු වෙනුවෙන් අඩු පොලියක් හිමිවන ඉතුරුම්කරුවන් වෙනුවෙන්, විකල්ප, නව්‍ය, ආරක්ෂාකාරී සහ ආකර්ෂණීය මූල්‍ය උපකරණ හඳුන්වා දීම සඳහා රටේ ප්‍රාග්ධන වෙළෙඳපොළ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. විශේෂයෙන් ම, විවිධ මූල්‍ය උපකරණ ආර්ථික වර්ධනයට අනුග්‍රහ දක්වන කටයුතු වෙත නැඹුරු කිරීම තුළින් සමස්තයක් ලෙස මූල්‍ය අංශය විසින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය වේ.

වසංගතයේ ආරම්භක අවධියේ දී දැඩි බලපෑමට ලක් වූ විදේශීය අංශය 2020 වසරේ මැද සිට යළිත් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. අත්‍යවශ්‍ය නොවන වෙළඳ භාණ්ඩ ආනයනය සහ බාහිරාභිමුඛ ආයෝජන සඳහා සීමා පැනවීම, ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් පහළ මට්ටමක පැවතීම මෙන් ම විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ලද ප්‍රේෂණ අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ යෑම, විනිමය අනුපාතිකය මත ඇති පීඩනය සහ විදේශීය අංශයේ අභියෝග පාලනය කිරීමට විශාල ලෙස උපකාරී විය. විදේශීය ජංගම ගිණුමේ ශේෂය ශක්තිමත් කිරීමට දායක වෙමින්, 2020 වසරේ දී වෙළඳ භාණ්ඩ ආනයන පහළ යෑමත් සමඟ වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. වසංගතයේ බලපෑම හේතුවෙන් සංචාරක ව්‍යාපාරයෙන් සහ වෙනත් සේවා අපනයනයෙන් ලද ඉපැයීම් අඩු විය. එහි බලපෑම තරමක් දුරට අඩු කරමින්, විදෙස්ගත ශ්‍රමිකයන් මුහුණ පෑ විවිධ අභියෝග මධ්‍යයේ වුව ද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. රටවල් අතර මූල්‍ය ප්‍රවාහ කෙරෙහි වසංගතය මගින් දැඩි බලපෑමක් ඇති විය. නැගී එන සියලු ආර්ථිකයන් සියල්ලම පාහේ අත් දුටු

පරිදි, රට වෙත සෘජු විදේශ ආයෝජන ගලා ඒම අඩු වූ අතර, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් හා කොටස් වෙළෙඳපොලවලින් මුදල් බැහැරට ගලා යැමක් වාර්තා වූව ද, දේශීය ආයෝජකයින්ගේ සක්‍රිය දායකත්වය සහිතව කොටස් වෙළෙඳපොල සැලකිය යුතු මට්ටමින් සාර්ථකව ක්‍රියාකාරී විය. කෙසේ වෙතත්, දළ නිල සංචිත ද ප්‍රමාණවත් මට්ටමක පැවති අතර, ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව ස්ථාවරව පැවතුණි. මහ බැංකුව ඉන්දියානු සංචිත බැංකුව සමඟ විදේශ මුදල් හුවමාරු ගිවිසුමකට එළඹි අතර, විදේශ විනිමය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරන තාවකාලික ප්‍රභවයක් ලෙස නිව්යෝර්ක්හි ෆෙඩරල් සංචිත බැංකුව සමඟ ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුමකට ද එළඹුණි. දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ වූව ද මහ බැංකුව විසින් සංචිත වර්ධනය කර ගැනීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම අඛණ්ඩව සිදු කළ අතර, 2020 වසරේ දී ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 300ක් පමණ විය. ඉදිරි කාල සීමාව තුළ දී විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහාය දක්වමින් මහ බැංකුවට විදේශ විනිමය මිලට ගැනීමේ ක්‍රමවේදය ඒ අයුරින්ම පවත්වාගෙන යැම සඳහා අපනයන ප්‍රවර්ධනය කිරීම, දේශීය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ ආනයන වියදම් අඩු කිරීම සඳහා වන ප්‍රතිපත්ති උපකාරී වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ආර්ථික පසුබෑම මධ්‍යයේ රජයේ ආදායම පහත වැටීම හේතුවෙන් 2020 වසර තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වයට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. එහි ප්‍රතිඵලයක් ලෙස මතු වූ අයවැය හිඟය, අඩු වියදම් සහිත දේශීය මූලාශ්‍ර හරහා සම්පූර්ණයෙන් ම මූල්‍යනය කරන ලද අතර, එමගින් රාජ්‍ය මූල්‍ය මත ඇති කරන පීඩනය බොහෝ දුරට සමනය විය. රජය විසින් සංවර්ධන අරමුණ පෙරදැරිව 2021 වසර සඳහා අයවැය ඉදිරිපත් කළ අතර, එමගින් දේශීය නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය කෙරේ. ඉදිරියේ දී, සාර්ව ආර්ථික ස්ථායිතාව සහ රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම පිණිස මැදි කාලීනව අයවැය හිඟය අඩු කිරීම සඳහා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අතිශය තීරණාත්මක සාධකයක් වේ.

වසංගතය විසින් මතු කරන ලද විවිධ අවිනිශ්චිතතා සහ පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ, 2020 වසරේ දී දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ද අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය වීම සඳහා මූල්‍ය ආයතනවලට අවැසි ද්‍රවශීලතාවය සහ නම්‍යශීලීබව ලබා දීම සඳහා මහ බැංකුව සම්ප්‍රදායෙන් බැහැර වූ නියාමන පියවර රැසක් අනුගමනය කළේය. මේ අතර, අර්බුදයට පත් බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයක බලපත්‍ර අවලංගු කිරීමට ද පියවර ගත් අතර, එවැනි සමාගම්වල තැන්පත්කරුවන්ගේ මුදල් පියවීමේ ක්‍රියාවලිය මේ වනවිට සිදු වෙමින් පවතී. බැංකු නොවන මූල්‍ය අංශයේ ඇති දුර්වලතා සහ අවදානම්වලට පිළියම් යෙදීම සඳහා, අභියෝගවලට ඔරොත්තු දෙන සහ හොඳින් ක්‍රියාත්මක වන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් පිහිටුවීමේ ප්‍රධාන සැලැසුමක් සකස් කෙරෙමින් පවතී.

2020 වසරේ දී මහ බැංකුව, ගෙවීම් හා පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා නව තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීමට ගත් සිය ප්‍රයත්න දෙගුණ කළේය. වැඩි වූ මුදල් ඉල්ලුම සපුරාලන අතර ම, වසංගත කාලය තුළ දී අනෙකුත් ගෙවීම් සහ පියවීම් පද්ධතිවල අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය ද සහතික කරන ලදී. සාමාන්‍ය ජනතාව විසින් ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා 2020 වසර ඩිජිටල් ගනුදෙනු වසර ලෙස නම් කරන ලද අතර, සාමාන්‍ය ජනතාව අතර එවැනි යාන්ත්‍රණ පිළිබඳ දැනුම්වත්භාවය සහ ව්‍යාප්තිය වැඩි කිරීම සඳහා බොහෝ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ඉදිරි කාලයේ දී සාමාන්‍ය ජනතාව විසින් මෙම කාර්යක්ෂම ගෙවීම් ක්‍රම වැඩි වශයෙන් භාවිත කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

වසංගතය නිසා මතු වූ දුෂ්කරතා මධ්‍යයේ වුව ද, සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) භාරකරු වශයෙන්, මහ බැංකුව විචක්ෂණශීලී ආයෝජන කටයුතු සිදුකරමින් සහ එහි සාමාජිකයින්ගේ අවශ්‍යතා නිසි කලට හා කාර්යක්ෂමව ඉටු කරමින් සිය කළමනාකරණ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන ගියේ ය.

අතිශය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ රාජ්‍ය ණය කළමනාකරණය සඵලදායී ලෙස සිදු කරන ලදී. වසංගතය නිසා ඇතිවූ සාර්ව ආර්ථික ගැටලුකාරී තත්ත්වය, වසර

ආරම්භයේ සිට සම්පූර්ණ වර්ෂයම සඳහා අයවැය ප්‍රතිපාදන නොමැති වීම සහ ශ්‍රී ලංකාව වැනි රටවලට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා සැලකිය යුතු ද්‍රවශීලතා බාධා පැවතීම හේතුවෙන් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යය අභියෝග රැසකට මුහුණ දුන්නේය. කෙසේ වෙතත්, පවත්නා ප්‍රතිපත්තිමය පසුබිම සහ දේශීය වශයෙන් පවත්නා ඉහළ ද්‍රවශීලතා තත්ත්වයන්ගෙන් වාසි ලබා ගනිමින්, 2020 වසරේ දී රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මහ බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව විචක්ෂණශීලී ණය කළමනාකරණ උපාය මාර්ගයක් සාර්ථකව ක්‍රියාත්මක කළේය. තවද, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ණය උපකරණ පදනම් කරගත් මූල්‍ය සම්පාදනයට පැවති අභියෝග මධ්‍යයේ, ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික මූල්‍යන ප්‍රභව සහ ඒකාබද්ධ මූල්‍යන විකල්ප භාවිතය වෙත යොමුවීමට පියවර ගත් අතර, රජයේ සියලුම ණය වගකීම් නිසි කලට සැපිරීමට පහසුකම් සැපයීය.

මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් 2019 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාව අසාදු ලේඛනයෙන් හෙවත් 'අළු ලැයිස්තුවෙන්' ඉවත් කිරීමෙන් පසුව, මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි අංශය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් සිදුකරන ලද කාර්ය අගය කරමින් යුරෝපා කොමිසම ද 2020 වසරේ දී ඔවුන්ගේ මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමට ඇති පාලන තන්ත්‍රයන්හි උපායමාර්ගික දුර්වලතා සහිත අධි අවදානම් තෙවන කාණ්ඩයේ රටවල් ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කළේය.

වසර තුළ දී මහ බැංකුව සිය ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ශක්තිමත් කළේය. සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කරමින් වසංගත සමයේ දී ව්‍යාපාර හා පුද්ගලයින්ට මහ බැංකුව සහාය විය. ප්‍රාදේශීය කාර්යාල හයේ ද සහාය ඇතිව අනෙකුත් සංවර්ධනාභිමුඛ ණය යෝජනා ක්‍රම අඛණ්ඩව පවත්වාගෙන යන අතර, රට තුළ සර්ව සහභාගිත්ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ සිය පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීමට ද මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

ඉහත සඳහන් කළ ආකාරයට, 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතයෙන් ආර්ථිකයට ඇති වූ බලපෑම ලිහිල් කිරීම සඳහා මහ බැංකුව අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. වසංගතයේ තර්ජනය තවමත් විශාල වශයෙන් පවතින බැවින්, 2021 වසරේ දී ද මුහුණ දීමට සිදුවන අභියෝග රැසක් පවතී. රට විසින් මුහුණ පා ඇති තීරණාත්මක ගැටලු රාශියක් විසඳීම සඳහා රජයේ ප්‍රතිපත්ති රාමුව වන 'සෞභාග්‍යයේ දැක්ම' මගින් අපේක්ෂා කරන පරිදි ඉහළ වර්ධන මාවතකට වේගයෙන් ගමන්කිරීම අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරමු. අඩු උද්ධමන වාතාවරණය සහ උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය වී පැවතීම සැලකිල්ලට ගත් කළ, මහ බැංකුවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති රාමුව මගින් මෙම ඉහළ වර්ධන මාවතකට සහාය වීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. මහ බැංකුව මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කරන අතර ම, ඉල්ලුම හේතුවෙන් මිල ස්ථායිතාවයට ඇති විය හැකි අභියෝගවලට මුහුණ දීම සඳහා මිල ප්‍රවණතා පිළිබඳව ද සුපරීක්ෂාකාරීව කටයුතු කරනු ඇත.

උක්ත කරුණු මගින් 2021 වසරේ පෙර දැක්ම සඳහා වන පසුබිම පැහැදිලි කෙරේ. මෙහිදී ඉදිරිපත් කෙරෙන මහ බැංකුවේ පුළුල් ප්‍රතිපත්ති රාමුව මගින් ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන්ට තමන්ගේ මෑත කාලීන සහ මැදි කාලීන ප්‍රතිපත්ති සැලසුම් සකස්කර ගැනීමට අනුබල ලබා දෙනු ඇත.

2021 වසරේ ප්‍රතිපත්ති පෙර දැක්ම මාතෘකා තුනක් යටතේ පෙළගැස්වේ:

**2 වන කොටස**: 2021 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ග සහ ප්‍රතිපත්ති

**3 වන කොටස**: 2021 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ ස්ථාවරත්වය සඳහා අදාළ වන මහ බැංකු ප්‍රතිපත්ති, සහ

**4 වන කොටස**: මහ බැංකුවේ සහායක සහ නියෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රතිපත්ති

## 2. 2021 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ග සහ ප්‍රතිපත්ති

අනෙකුත් ගෝලීය ආර්ථිකයන් මෙන්ම ශ්‍රී ලංකාව ද 2020 වසරේ දී, විශේෂයෙන් දෙවන කාර්තුවේ දී, සැලකිය යුතු ආර්ථික පසුබෑමකට ලක් විය. උද්ධමනය පාලනය වී ඇති වාතාවරණයක් යටතේ, වසංගතයෙන් පීඩාවට පත් ආර්ථිකය නගාසිටුවීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පෙර නොවූ පරිමාණයකින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග සහ රජය විසින් ආරම්භ කරන ලද ආර්ථික පුනර්ජීවන වැඩසටහන් 2020 වසරේ තුන්වන කාර්තුව තුළ දී ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමකින් යථා තත්ත්වයට පත්වීමට හේතු විය. කෙසේ වෙතත්, කොවිඩ්-19හි දෙවන රැල්ල පැතිර යෑම, වසරේ අවසාන කාර්තුවේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම කෙරෙහි යම් දුරකට බලපෑම් ඇති කළේය. 2020 වසරේ පළමු කාර්තුවේදී සුළු සංකෝචනයක් ද, දෙවන කාර්තුවේදී සාපේක්ෂව විශාල සංකෝචනයක් ද වාර්තා කිරීමෙන් අනතුරුව, ආර්ථිකය තෙවන කාර්තුවේදී සුළු වශයෙන් ධන වර්ධනයක් වාර්තා කළේය. සිව්වන කාර්තුවේ ප්‍රවණතා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, ආර්ථිකය වසර තුළ දී සියයට 3.9ක පමණ සංකෝචනය වීමක් වාර්තා කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. අභියෝගාත්මක දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ආර්ථිකයට ප්‍රමාණවත් උත්තේජනයක් ලබා දීම සඳහා මුදල් හා රාජ්‍ය මූල්‍ය මැදිහත්වීම් තුළින් අඛණ්ඩ සහයෝගය අත්‍යවශ්‍ය බව මහ බැංකුවේ අදහසයි. එමනිසා, ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත අන්දමට යථාතත්ත්වයට පත්වීම සහතික කිරීම සඳහා මහ බැංකුව දැනට පවත්නා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2021 වසරේදී ද අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. එහෙත්, උද්ධමන ප්‍රවණතා කෙරෙහි ආර්ථිකයේ සමස්ත ඉල්ලුම මත පදනම්ව ඇති විය හැකි ඕනෑම පීඩනයක් වළක්වා ගැනීම සඳහා අපි නිරතුරුවම සාර්ව ආර්ථිකයේ සිදුවන වෙනස්වීම් සමීපව නිරීක්ෂණය කරන්නෙමු.

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය විභව නිමැවුම් මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතින බව කවුරුත් දන්නා කරුණක් වන අතර, කොවිඩ්-19 පැතිර යෑම හමුවේ මෙම තත්ත්වය තවත් උග්‍ර විය. ආර්ථික වර්ධනය අරමුණු කරගනිමින් 2020

වසරේ දී හඳුන්වා දුන් හිතකර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මූර්ත ආර්ථිකයට කාර්යක්ෂම ලෙස සම්ප්‍රේෂණය වීමට යම් කාලයක් ගතවනු ඇතැයි අපි විශ්වාස කරමු. අහිමි වූ වර්ධනය ළඟාකර ගැනීමටත්, අපේක්ෂිත ඉහළ වර්ධන මාවත සමඟ තිරසාරව යථාතත්ත්වයට පත්වීමටත් ආර්ථිකයට යම් කාලයක් අවශ්‍ය වනු ඇත. දැනට දක්නට ලැබෙන ඉහළ මුදල් ප්‍රසාරණය හැරුණු විට, ආර්ථිකය එහි විභව මට්ටම කරා ළඟා වන තුරු දේශීය ආර්ථිකය තුළ සැලකිය යුතු ඉල්ලුම් පීඩනයක් ඇති වනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. මහ බැංකුව නිරන්තරයෙන් සුපරීක්ෂාකාරීව කටයුතු කරනු ඇති නමුත්, මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත සියයට 4-6 පරාසයේ පවතිනු ඇති බවට විශ්වාස කෙරේ. ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑම සහ ගෝලීය ඉල්ලුමේ ඇති විය හැකි වර්ධනය මෙන් ම, දේශීය සැපයුම් අංශයේ සාධක මගින් වන පීඩන වැනි බාහිර සාධකවලින් උද්ධමන අවදානම් ඇති විය හැකිය. අපේක්ෂිත පරාසය තුළ උද්ධමනය පවත්වා ගැනීම සඳහා මහ බැංකුව විසින් ගනු ලබන උත්සාහයට සහාය වන පරිදි රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් එවැනි සැපයුම් අංශයේ සාධක පාලනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වසර 12ක් පුරාවට උද්ධමනය තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමේ ප්‍රතිලාභය ඔස්සේ ආර්ථිකය තුළ ස්ථිර තනි අගයක පොලී අනුපාතික ව්‍යුහයක් ස්ථාපිත කිරීමට මහ බැංකුව බලාපොරොත්තු වෙයි. ඉදිරියේ දී වෙළෙඳපොළ පොලී අනුපාතික තනි අගයක මට්ටමේ පවත්වාගෙන යෑම කෙරෙහි අපගේ අවධානය යොමු කර ඇත. අඩු පොලී අනුපාතිකවලට අනුරූප වූ අඩු පිරිවැය ණය පහසුකම් මගින් ව්‍යාපාරික ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙනු ඇත. තිරසාර ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය පදනම වන රටේ ආයෝජන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙය අත්‍යවශ්‍ය වේ. තිරසාර පදනමක් මත අරමුදල් පිරිවැය අඩු මට්ටමක පැවතීම, නව ව්‍යාපාර ඇතුළු ව්‍යාපාරවලට ඉහළ වර්ධන හැකියාවක් ඇති නව කර්මාන්ත සහ නව අංශවලට පිවිසීමට දිරිගැන්වීමක් වනු ඇත.

ස්ථාවර ආදායම් උපයන්නන්, විශේෂයෙන් ම විශ්‍රාම වැටුප් මත යැපෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වැනි ඇතැම් සමාජ කණ්ඩායම් තැන්පතු පොලී අනුපාතික අඩු වීම

හේතුවෙන් සැලකිය යුතු ලෙස බලපෑමට ලක් වන බව මහ බැංකුව හඳුනාගෙන ඇත. මෙම ගැටලුව සඳහා දිගු කාලීන තිරසාර විසඳුම වනුයේ ආදායම් වර්ධනය සහ පොදු අරමුදල්, රක්ෂණ හා ආදායම් යෝජනා ක්‍රම, විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රම හා සම්බන්ධ ආයතනික වර්ධනයන් ය. සමාජයේ අවදානමට ලක්විය හැකි එවැනි අංශ සඳහා සහාය වන නව මූල්‍ය උපකරණ වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුව මූල්‍ය අංශය සමඟ අඛණ්ඩව කටයුතු කරනු ඇත. රාජ්‍ය ආයතන මෙන් ම, පෞද්ගලික අංශයේ සේවකයන්හට අනුග්‍රහය දැක්වීම සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට රජය ද යෝජනා කර තිබේ. 2021 අයවැය මගින් යෝජනා කළ පරිදි, අඩු උද්ධමනය සහ අඩු පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය වීම සඳහා වෙනත් සමාජ ආරක්ෂණ ජාල යෝජනා ක්‍රම පිහිටුවීමට ද අපේක්ෂා කෙරේ.

ණය පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීම සහ වෙළඳපොළේ ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පැවතීම, අඩු පිරිවැය ණය වශයෙන් පෞද්ගලික අංශයට අරමුදල් සැපයීම සඳහා උපකාරී වේ. පෞද්ගලික අංශයට සපයන ණය 2021 වසරේ දී සියයට 14.0කින් පමණ සහ මැදි කාලීනව අවම වශයෙන් වාර්ෂිකව සියයට 12.0 - 12.5කින් පමණ වර්ධනය වනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරන අතර, එමගින් ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනය ළඟා කර ගැනීමට සහායක් ලැබෙනු ඇත.

අඩු පොලී අනුපාතික ව්‍යුහයක් තිරසාරව පවත්වාගැනීම සඳහා, අත්‍යවශ්‍ය නොවන ආනයන හා ආයෝජන ලෙස විදේශ විනිමය විශාල වශයෙන් රටෙන් බැහැරට ගලායෑම අවම කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් දේශීය නිෂ්පාදන ආර්ථිකයට ලිහිල් මුදල් ප්‍රතිපත්ති තත්ත්ව මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට ඉඩ සැලසෙයි. ආර්ථිකයේ හඳුනාගත් අංශවලට සහාය වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ද යොමු කෙරෙනු ඇති අතර, සියලු පාර්ශ්වකරුවන් සමඟ අදහස් හුවමාරුවකින් අනතුරුව ප්‍රමුඛතා අංශ සහ ශීඝ්‍රයෙන් වර්ධනය වන කර්මාන්ත සඳහා ණය ලබා දීමේ ඉලක්ක වසර තුළදී හඳුන්වා දෙනු ඇත.

සමස්තයක් වශයෙන්, වෙළඳපොළ ආර්ථික රාමුවක් තුළ ක්‍රියාත්මක වන අතර ම, 1977 වසරේ සිට හඳුන්වා දෙනු ලැබූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිවල ක්‍රියාකාරීත්වය දැඩි ලෙස විමර්ශනයට ලක් කෙරෙනු ඇති අතර, කාර්මික ආර්ථිකයක් බවට පත්වීම උදෙසා, රටට සහ එහි ආර්ථික නියෝජිතයින්ට ඉලක්කගත ප්‍රවේශයක් අනුගමනය කිරීමට හැකි වනු ඇත. කෙටි කාලීන වෙළඳපොළ ව්‍යාකූලතා සහ කෙටි කාලීන අසීමිත මූල්‍ය වාසි මගින් මෙහෙයවනු ලැබීමට වඩා, එවැනි දිගුකාලීන අරමුණු සහිත ප්‍රතිපත්ති රාමුවක් මගින් ඉහළ සාර්ව ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ඇත. 'සෞභාග්‍යයේ දැක්ම' සහ 2021 අයවැය ලේඛනයේ දක්වා ඇති ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, දේශීය නිෂ්පාදනය, විශේෂයෙන් කෘෂිකාර්මික හා කර්මාන්ත අංශ, වැඩි දියුණු කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය සහාය ලබා දී ඇත. මෙම රාජ්‍ය මූල්‍ය සානුබල සහ දිරිගැන්වීම් දේශීය සැපයුම් වැඩි දියුණු කිරීමට උපකාරී වෙමින් රට තුළ ප්‍රාග්ධන පදනම පුළුල් කිරීමට දායක වනු ඇත. මෙම වර්ධනයන්, රට ආනයන මත යැපීම අඩු කරන අතර, කෘෂිකාර්මික සහ කාර්මික අංශයේ සැපයුම් වල දේශීය නිෂ්පාදන අනුපාත ඉහළ නංවයි. තවද, දේශීය සැපයුම වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශීය තරගකාරිත්වය සහ අපනයන ශක්‍යතාව ඉහළ නැංවෙන අතර, දේශීය උද්ධමනයේ කාලීන විචලනයන් ද විශාල වශයෙන් අඩු කරයි. රට වේගවත් වර්ධන මාවතකට යොමු කිරීම හා තිරසාරව සමෘද්ධිය පවත්වා ගැනීම සඳහා සාමූහික ප්‍රවේශයක් සහතික කිරීම පිණිස නව සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවේ මෙම අංග මහ බැංකුවේ ආර්ථික කළමනාකරණ තීරණවලට වඩාත් සමීපව ඇතුළත් කෙරෙනු ඇත.

අපි අභියෝගාත්මක කාලයන් පසුකරමින් සිටින්නෙමු. නව සහ ඉදිරියේදී එල්ල විය හැකි අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට හැකිවන පරිදි දේශීය මෙන් ම ගෝලීය මුදල් හා සාර්ව ආර්ථික වර්ධනයන් සමීපව නිරීක්ෂණය කිරීම වැදගත් වේ. මේ සඳහා, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී විධිමත් විශ්ලේෂණ සිදු කිරීමට මහ බැංකුව විසින් සාම්ප්‍රදායික මෙන් ම සාම්ප්‍රදායික නොවන දත්ත මූලාශ්‍ර භාවිත කරනු ඇත. අප විසින් සාම්ප්‍රදායික දත්ත මූලාශ්‍ර සහ උද්ධමන අපේක්ෂා සමීක්ෂණ හා ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ වැනි ක්‍රම භාවිතා කිරීමට අමතරව, නව්‍ය ප්‍රවණතා පිළිබඳ

අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා විකල්ප මූලාශ්‍ර තුළින් ලබා ගන්නා ඉහළ සංඛ්‍යාත දත්ත (high frequency data) මෙන් ම ඉතා දියුණු පරිගණක මෘදුකාංග මගින් ලබාගන්නා දත්ත (machine learning) සහ වෙනත් දත්ත විශ්ලේෂණය සඳහා වන විද්‍යාත්මක ශිල්පීය ක්‍රම ඇතුළු නව ක්‍රමවේද අඛණ්ඩව භාවිතා කරන්නෙමු. ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (Forecasting and Policy Analysis System) යටතේ අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතිය තුළින් ලබා ගන්නා මැදිකාලීන පුරෝකථන අප විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන අතර, ප්‍රධාන පාර්ශ්වකරුවන් වෙත මග පෙන්වීම සඳහා උද්ධමනය සහ ආර්ථික වර්ධනය ඇතුළු ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ඉදිරි කාලීන හැසිරීම පිළිබඳ තොරතුරු සපයන්නෙමු. මෙම ක්‍රියාවලියේ එක් කොටසක් ලෙස, මෙම වසරේ දෙවන භාගයේ සිට විස්තරාත්මක මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට මහ බැංකුව අදහස් කරයි. එමගින් ආර්ථික ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණයක් මෙන් ම, ප්‍රධාන සාර්ව ආර්ථික විචලනයන්ගේ වෙනස් වීම පිළිබඳ පුරෝකථන ඉදිරිපත් කරනු ඇත. සාර්ව ආර්ථික පුරෝකථනයන් මෙසේ සන්නිවේදනය කිරීම මගින් විනිවිදභාවය වැඩි වනු ඇති බවත්, අනාගත දිශානතිය පිළිබඳ පැහැදිලිභාවයක් ලබා දෙන බවත්, මැදි කාලීනව එවැනි දිශානති වටා පවතින අවදානම් පෙන්වාදිය හැකි බවත් අපි විශ්වාස කරමු.

2020 වසර තුළ දී, අපට අතිශය අභියෝගාත්මක විදේශීය වාතාවරණයකට මුහුණ දීමට සිදු වූ බැවින්, රට තුළට පැමිණෙන විදේශ විනිමය ගලා ඒම් දිරිමත් කරන අතර ම, අත්‍යවශ්‍ය නොවන වෙළඳ භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දීමට සිදු විය. විදේශ සංචිත ක්ෂය නොවී විනිමය අනුපාතිකයට ඇති පීඩනය පාලනය කිරීමට මෙවැනි පියවර උපකාරී විය. වෙළඳපොළ බලවේගයන්ට අනුව විනිමය අනුපාතිකය තීරණය වීමට ඉඩ හැරීම පිළිබඳ මහ බැංකුවේ ස්ථාවරය ඉදිරියේදී ද නොවෙනස්ව පවතිනු ඇත. කෙසේ වෙතත්, ඇතැම් වෙළෙඳපොළ සහභාගිවන්නන්ගේ සමපේක්ෂණ ක්‍රියාකාරකම් හෝ මුදල් ප්‍රවාහයන්ගේ නොගැලපීම් හේතුවෙන් විනිමය අනුපාතිකයේ ඇතිවන අධික විචලන දැඩි ලෙස අධීක්ෂණය කෙරෙනු ඇති අතර, සමස්ත ආර්ථිකයේ වැඩි යහපත උදෙසා නිවැරදි

කිරීමේ ක්‍රියාමාර්ග ගනු ඇත. අසීරු කාලවලදී විශාල පිරිසකගේ වියදමින් සුළු පිරිසක් අනිසි පෞද්ගලික වාසි ලබා ගැනීමට සිදුකරන වෙළඳපොළ හැසිරවීම් කිසිසේත් දරා නොගනු ඇත. දේශීය ආර්ථිකයට බාහිර ක්‍රියාකාරකම්වල වෙනස්වීම් මගින් ඇති වන බලපෑම සමනය කිරීම සඳහා විනිමය අනුපාතිකය තවදුරටත් කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියා කරනු ඇති අතර, 2020 වසරේ දී සිදු කළ පරිදි, විනිමය අනුපාතිකයේ අනවශ්‍ය විචලනයන් අවම කිරීම සඳහා මෙන් ම, විදේශ සංචිත ගොඩනැංවීම සඳහා සුදුසු පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත මැදිහත් වනු ඇත. මූර්ත අංශයේ අපේක්ෂිත වර්ධනයන් විනිමය අනුපාතික ස්ථායීතාව පවත්වා ගැනීමට උපකාරී වනු ඇතැයි මහ බැංකුව විශ්වාස කරයි. ද්විත්ව හිඟයන් තුළ පාලනය කිරීමට අපහසු යැයි සැලකෙන වෙළඳ හිඟය සැලසුම් සහගතව අඩු කළ හැකි බව 2020 වසර සඳහා වන දත්ත මගින් පෙන්නුම් කර ඇත.

මේ අතර, මහ බැංකුව සිය ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මේ වසර අවසන් වන විට හඳුන්වා දෙනු ඇත. 2020 වසර තුළදී මේ හා සම්බන්ධ මූලික කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ස්ථාපිත කිරීමෙන් පසු, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය බැංකු අංශය ඔස්සේ රටවල් අතර සිදු කරන විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීම සඳහා පුළුල් වේදිකාවක් සපයනු ඇත. සැලසුම් කර ඇති පරිදි මෙම ව්‍යාපෘතිය සාර්ථකව ස්ථාපිත කිරීම සඳහා ඉදිරි මාස කිහිපය තුළ දී බැංකු අංශයේ අඛණ්ඩ සහයෝගය අපි අපේක්ෂා කරමු.

වසංගතය සහ එමගින් ඇතිවූ පුළුල් බලපෑම් අපගේ ආර්ථික උපාය මාර්ග පිළිබඳව නැවත සිතා බලන ලෙස අප සැමට බල කර සිටියි. අතීතයේ දී, ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා අප ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් සහ බහුපාර්ශ්වීය ආයතනවලින් ණය ලබා ගත් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ විදේශ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2009 වසරේ සිට ඇරඹි විදේශ වාණිජ ණය ගැනීම්, ආරම්භක වසරවල අඩු මට්ටමක පැවතුණි. 2009 සිට 2014 දක්වා ආරම්භක වසර හය තුළ නිකුත් කරන ලද මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන

5,000කි. ඉන් අනතුරුව, 2015 සිට 2019 දක්වා පස් වසරක කාලය තුළ නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 12,050 දක්වා ඉහළ ගොස් ඇති අතර එමඟින් වාණිජ ප්‍රභවයන්ගෙන් ලබාගත් රටේ විදේශ ණය සැලකිය යුතු ලෙස ඉහළ නැංවී තිබේ. වර්තමාන වෙළඳපොළ තුළ අනුගමනය කෙරෙන ගෝලීය අවදානම් මග හරවා ගැනීම සහ මූල්‍ය වෙළඳපොළ විචලනයන් ශ්‍රී ලංකාවේ විදේශ මූල්‍යකරණ අපේක්ෂාවන්ට අහිතකර ලෙස බලපා ඇත. එවැනි පසුබිමක් තුළ, සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ගැනීමට දේශීය මූල්‍ය ප්‍රභවයන් කරා යොමු වීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය අගය කළ යුතු වේ. මෙම ක්‍රියාමාර්ගවලට සහාය වීම සඳහා, රාජ්‍ය අංශය මෙන් ම පෞද්ගලික අංශය විසින් ද ක්‍රියාත්මක කරනු ලබන වර්ධනය අරමුණු කරගත් ව්‍යාපෘති සඳහා දේශීය අරමුදල් ප්‍රභවයන් උපරිමයෙන් යොදවමින් මූල්‍ය වෙළඳපොළ සක්‍රීය ලෙස දායක වීම අවශ්‍ය වේ.

මෙවැනි අභියෝගාත්මක කාලවල දී ආර්ථිකය මෙහෙය වීම සඳහා මහ බැංකුව සහ රජය අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කරනු ඇත. අවශ්‍ය රාජ්‍ය මූල්‍ය අවකාශය සාක්ෂාත් කර ගැනීමට සහ 2025 වසර වන විට අපේක්ෂිත ඉලක්කය වන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක හිඟයක් දක්වා අයවැය හිඟය අඩු කර ගැනීම සඳහා රජයේ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව අපේක්ෂිත පරිදි සාර්ථකව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය මිල ස්ථායීතාවයකින් යුත් තිරසාර ස්ථාවර වර්ධනයක් අපේක්ෂා කරන වැඩපිළිවෙළ සඳහා මහත් සේ ප්‍රයෝජනවත් වනු ඇත. අඩු උද්ධමනය, අඩු පොලී අනුපාතික වාතාවරණය තිරසාරව පවත්වා ගැනීමට උපකාරී වෙමින් රජයේ මෙන් ම පෞද්ගලික අංශයේ අරමුදල් පිරිවැය අඩු කරනු ඇත. ආර්ථිකය අපේක්ෂිත වර්ධන මාවත ඔස්සේ මෙහෙයවීම සඳහා අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වා දීමට හා ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව රජය සමඟ එක්ව කටයුතු කරනු ඇත. රජයේ ආදායම ඉහළ නැංවීම සහ රජයේ වියදම් අවම කිරීම අරමුණු කර ගත් පියවර සමඟ, මෙම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, ඉදිරියේ දී රාජ්‍ය ණයෙහි තිරසාර බව සහ පහසු කළමනාකරණය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ අතර, අවශ්‍ය බදු ප්‍රතිසංස්කරණ මෙන් ම, ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ

තුළින් රජය ආයෝජනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇති අතර, එමගින් ශ්‍රී ලංකාව දේශීය මෙන්ම විදේශ ආයෝජන සඳහා එක සේ විශ්වාසදායී වෙළඳපොළක් බවට පත් කර තිබේ. තවද, දේශීය ආයෝජකයින්ට අවස්ථා ලබා දෙන අතර ම, විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා තෝරා ගැනීමේ ප්‍රවේශයක් අනුගමනය කරන බව රජය නිවේදනය කර ඇත. මෙසේ විදේශ ණය හිතකර මට්ටමක පවත්වාගැනීම සහ දේශීය මෙන්ම විදේශීය සෘජු ආයෝජන සඳහා දිරිගැන්වීම් ලබා දීම ඉදිරියේ දී විදේශ ණය ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට ඉවහල් වන අතර ම, නිල සංචිත හා විනිමය අනුපාතිකය මත ඇති වන පීඩනයන් අවම කරයි. 2021 අයවැයෙන් යෝජනා කළ පරිදි, කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය නැගෙනහිර සහ බටහිර වෙළඳපොළ සම්බන්ධ කරන ආකර්ෂණීය ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම, කොළඹ සහ හම්බන්තොට වරායන් වෙළඳ මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම සහ උපායමාර්ගික සංවර්ධන පනත යටතේ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සඳහා නවීන ආයෝජන කලාපයක් ඇති කිරීම මගින් ඉදිරියේ දී සැලකිය යුතු විදේශ ප්‍රාග්ධන ප්‍රවාහ රට වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රාග්ධන ප්‍රවාහ, අනුමත කළ හැකි ව්‍යාපෘති ණය සහ මිත්‍ර රටවලින් ලැබෙන සහයෝගය ආදී වශයෙන් රට වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන විදේශ විනිමය අරමුදල් ලැබීමත් සමඟ විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති නොවන ලෙස, ප්‍රමාණවත් සංචිත මට්ටමක් පවත්වා ගැනීම සඳහා අපනයන ආදායමෙන් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වෙළඳපොළෙන් මිලදී ගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

මහ බැංකුව අඛණ්ඩව පූර්ව දින දර්ශනයක් මත පදනම්ව සිය මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කරනු ඇත. 2021 වසර සඳහා මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත්කරන දින පහත දැක්වේ.

## 2021 වසරේ මුදල් ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීම සඳහා වන පූර්ව දින දර්ශනය

| නිවේදන අංකය | නිවේදන දිනය |
|---|---|
| 1 | ජනවාරි 19, අඟහරුවාදා |
| 2 | මාර්තු 04, බ්‍රහස්පතින්දා |
| 3 | අප්‍රේල් 08, බ්‍රහස්පතින්දා |
| 4 | මැයි 20, බ්‍රහස්පතින්දා |
| 5 | ජූලි 08, බ්‍රහස්පතින්දා |
| 6 | අගෝස්තු 19, බ්‍රහස්පතින්දා |
| 7 | ඔක්තෝම්බර් 14, බ්‍රහස්පතින්දා |
| 8 | නොවැම්බර් 25, බ්‍රහස්පතින්දා |

## 3. 2021 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයට අදාළ ප්‍රතිපත්ති

ඉදිරියේ දී ඉහළ හා තිරසාර ආර්ථික වර්ධන මාවතක් වෙත ළඟා වීම සඳහා ආර්ථිකයේ සියලුම අංශවල දායකත්වය අත්‍යවශ්‍ය වේ. සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා රටේ මූල්‍ය අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මධ්‍යයේ, මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාව පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුවේ කාර්යභාරය ඵලෙසින්ම ක්‍රියාත්මක කිරීම 2020 වසරේ දී අභියෝගාත්මක විය. මෙම වසංගතයෙන් ව්‍යාපාර හා පුද්ගලයින්ට ඇති කළ අනපේක්ෂිත ප්‍රතිවිපාක මූල්‍ය පද්ධතියේ ශක්තිමත් බව සහ හැකියාවන් පරීක්ෂාවට ලක් කළේය. අභියෝගාත්මක ගෝලීය හා දේශීය පරිසරයක් තුළ ගතික හා අවදානම්වලට ඔරොත්තු දිය හැකි මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුව විසින් ගත් උත්සාහයන්හි දී කාර්යක්ෂම අධීක්ෂණය, නියාමනය, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ විශ්වසනීය ගෙවීම් හා පියවීම් පද්ධති අවශ්‍ය විය.

කොවිඩ්-19 වසංගතය පැතිර යත් ම, මහ බැංකුව තමන් විසින් ම මෙහෙයවනු ලැබ ක්‍රියාවට නැංවූ තීරණවලට මෙන්ම, බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින්ට සහන සැලසීමට අති ගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද නියෝගයට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට මූල්‍ය පද්ධතිය හරහා පහසුකම් සැලසීමට ද කඩිනම් පියවර ගත්තේය. එබැවින්, 2020 වසරේ දී විවිධ ප්‍රතිපත්ති, මෙහෙයුම් හා නියාමන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී. බොහෝ ව්‍යාපාර හා පුද්ගලයින්ගේ මුදල් ප්‍රවාහ වසංගතයේ බලපෑමට ලක් වූ බැවින්, නිෂ්පාදන, සේවා, කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් අංශවල නියැළී සිටින සුදුසුකම්ලත්, ලබා ගත් ණය හා සම්බන්ධව සක්‍රීය හා අක්‍රීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ණය සහන කාල සීමාවන් හා කාරක ප්‍රාග්ධන පහසුකම් ඇතුළු සහන මාලාවක් ලබා දීමට මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට නියෝග කරන ලදී. කොවිඩ්-19 දෙවන රැල්ල හේතුවෙන් ව්‍යාපාර හා පුද්ගලයින් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින්ට ප්‍රදානය කර තිබූ ණය සහන කාලසීමාවන්

තවදුරටත් දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී. මීට අමතරව, සමාන මාසික වාරිකවලින් ආපසු අය කරගන්නා ණය හා සම්බන්ධව, ණය සහන කාලසීමාවට අදාළ වන පොලිය උපරිම වශයෙන් සියයට 7.00ක වාර්ෂික පොලියකට සීමා කිරීමට ද, පොදු ප්‍රවාහන සේවා සපයන බස් රථ සඳහා ලබා දී ඇති කල් බදු පහසුකම් වෙනුවෙන් අය කරන පොලිය වාර්ෂිකව සියයට 4.00කට සීමා කිරීමට ද බලපත්‍රලාභී බැංකුවලට දන්වන ලදී. සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන යෝජනා ක්‍රම ද ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන්, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්හට කාරක ප්‍රාග්ධනය සහනදායී පොලී අනුපාතික යටතේ ලබා දීමට මහ බැංකුව අදාළ බැංකුවලට පහසුකම් සලසන ලදී. කුඩා පරිමාණ ණය ගැනුම්කරුවන්ට අනුග්‍රහ දැක්වීම සඳහා, අගරු චෙක්පත් ගාස්තු, ගෙවීම් අත්හිටුවීමේ ගාස්තු සහ ණය ගෙවීම ප්‍රමාද වීමේ දී අයකරන ගාස්තු යනාදිය අය කිරීම අත්හිටුවීමට බැංකුවලට නියෝග කරන ලදී. අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගෙන් ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ද අත්හිටුවනු ලැබූ අතර, අක්‍රීය ණය සඳහා අය කරන දඩ පොලිය අත්හරින ලදී.

කුඩා පරිමාණ ණය ගැනුම්කරුවන්ට සහනයක් ලෙස සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත ගලා යන මූල්‍ය සම්ප්‍රේෂණ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් අධික යැයි සලකනු ලැබූ විශේෂිත ණය අනුපාතික අඩු කිරීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ගයක් ලෙස, ණයපත්, රන් භාණ්ඩ උකස් කිරීම, කලින් අනුමත කරගත් තාවකාලික අයිරා, දඩ පොලී අනුපාතික සහ නිවාස ණය වැනි ණය වර්ග මත උපරිම පොලී අනුපාතික ද පනවන ලදී.

ආර්ථිකයේ අනෙකුත් අංශවල මූල්‍යමය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහසුකම් සැලසීම මූල්‍ය අංශයේ පරමාර්ථය වන බැවින්, මහ බැංකුව විශේෂිත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබූ අතර, එමගින් බැංකුවල ද්‍රවශීලතා තත්ත්වය මත ඇති විය හැකි අහිතකර බලපෑම මග හරවා ගැනීමේ අපේක්ෂාවෙන් බැංකුවලට ද්‍රවශීලතාව සපයමින් මූල්‍ය අංශය මත වන පීඩනය අවම කරන ලදී. ඒ සමගම, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය සංගමය සහ ආසියානු සංවර්ධන බැංකුව ආදී බහුපාර්ශ්වීය මූල්‍ය

සංවිධානවල ආයෝජන තුළින් බැංකු පද්ධතියට ලැබෙන ප්‍රතිලාභ සලකා බලමින්, බැංකු පනත යටතේ නිකුත් කර ඇති විධානවලට විවිධ සංශෝධන සිදු කරන ලදී.

දුෂ්කරතා මධ්‍යයේ වුව ද, සංස්ථාපිත ආදායම් බදු සහ අනෙකුත් බදු අනුපාතික අඩු කිරීම මගින් ඇති වූ සහාය ද සමඟ 2020 වසරේ දී බැංකු අංශය පුළුල් වූ අතර, එමගින් ලාභ සහ බදු ගෙවීමෙන් පසු හිමිකම් මත ප්‍රතිලාභ වැඩිවීමක් ද, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව නියාමන අවම අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමකින් පවත්වා ගනිමින් කම්පනවලට ඔරොත්තු දීම සඳහා බැංකු අංශය සතු හැකියාව ඉහළ යෑමක් ද පෙන්නුම් කරයි.

2020 වසර තුළ දී, බැංකු අංශයට සහ මූල්‍ය පද්ධතියට ලබා දී ඇති විවිධ සහාය සහ නීති ලිහිල් කිරීම්වල අරමුණ වූයේ එක් අතකින් මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමත්, අනෙක් අතින් ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත්කිරීම සඳහා පහසුකම් සැලසීමත් ය. එබැවින්, මෙම ලිහිල් කිරීම්වල ප්‍රතිලාභ තම ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන මෙන් බලපත්‍රලාභී බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනවලින් ඉල්ලා සිටින අතර, එමගින් ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා හිතකර මූල්‍ය වාතාවරණයක් ඇති කරමින් අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ආර්ථික පරිසරයක් තුළ ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීමට හැකි වනු ඇත. නව සාමාන්‍යය (New Normal) පසුබිම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මූල්‍ය අංශය නව ව්‍යාපාර ආකෘතියක් නිර්මාණය කළ යුතු අතර, එය වඩාත් පාරිභෝගික කේන්ද්‍රීය විය යුතු ය.

මහ බැංකුව මේ වන විට මූල්‍ය සමූහයන්හි අවදානම් මත පදනම්ව සිදු කෙරෙන ඒකාබද්ධ අධීක්ෂණවලදී (Group-wide Consolidated Supervision) අනුගමනය කළ යුතු සමූහ ඒකාබද්ධ අධීක්ෂණ රාමුවක් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් සිටියි. අදාළ අධීක්ෂණ බලධාරීන්ගේ නිරීක්ෂණ මත පදනම්ව, මහ බැංකුව සීමිත ඒකාබද්ධ අධීක්ෂණයන් සිදු කරමින් 2020 වසරේ දී ඒකාබද්ධ අධීක්ෂණ රාමුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ ය. මීට අමතරව, 2020 වසරේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, 2021 වසර තුළ හැකි සෑම අවස්ථාවකදී ම බලපත්‍රලාභී බැංකු හා සම්බන්ධ වෙනත් නියාමන ලිහිල් කිරීම් සිදු කිරීමට මහ බැංකුව සලකා බලනු ඇත. රටේ මූල්‍ය

පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල නෛතික හා නියාමන රාමුව වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම වසර තුළ දී බැංකු පනත සමාලෝචනය කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. සංවර්ධන බැංකු වැනි හඳුනාගත හැකි විශේෂ වෙළෙඳපොළ සඳහා සේවා සපයන බැංකු ආයතන පිළිගනු ලැබේ. විශාල වාණිජ බැංකු කලාපීය වෙළෙඳපොළ දක්වා ව්‍යාප්ත කිරීමේ මාර්ග පිළිබඳව සොයා බැලීමට දිරිගන්වනු ලබයි. වඩාත් සුදුසු ලෙස ශක්තිමත් මූල්‍ය තත්ත්වයන් සහ ශක්‍ය ව්‍යාපාර ආකෘතීන් ඇති විශාල බැංකු සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ වීමේදී වෙළෙඳපොළ විසින් මෙහෙයවනු ලබන ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වීමට මහ බැංකුව තවදුරටත් පහසුකම් සලසනු ඇත.

අර්බුදකාරී අවස්ථා සඳහා පෙර සූදානම් වීමේ අවශ්‍යතාවය කොවිඩ්-19 වසංගතය මගින් අවධාරණය කෙරිණි. අහිතකර අවස්ථාවන්ට කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කරමින් අර්බුදකාරී අවස්ථා සඳහා පෙර සූදානම ශක්තිමත් කිරීමට බලපත්‍රලාභී බැංකු සිය ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සඳහා අවශ්‍ය විධිවිධාන ඉදිරියේ දී නිකුත් කරනු ඇත. මහ බැංකුව සිය අධීක්ෂණ ප්‍රවේශයන් නව සාමාන්‍යයට සරිලන පරිදි අනුවර්තනය කරනු ඇත. බලපත්‍රලාභී බැංකුවලට තාක්‍ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ නියාමන රාමුවක් ද හඳුන්වා දෙනු ඇත. මෙමගින් බැංකුවලට තම තොරතුරු පද්ධති සහ තාක්‍ෂණික ක්‍රමවේදයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා යහ භාවිතයන්ට අනුකූලව වැඩිදියුණු කිරීමට හා ශක්තිමත් කිරීමට බැංකු පොළඹවනු ඇත. මේ සම්බන්ධයෙන්, කෘතිම බුද්ධිය (artificial intelligence) සහ දියුණු පරිගණක මෘදුකාංග ආශ්‍රයෙන් සිදු කෙරෙන ඉගෙනීමේ (machine learning) හැකියාවන් උපයෝගී කර ගනිමින් දත්ත මත පදනම්ව දුරස්ථ අධීක්ෂණ කටයුතු සිදු කිරීම විධිමත් කිරීම සඳහා අධීක්ෂණ තාක්ෂණය (SupTech) සහ නියාමන තාක්ෂණ (RegTech) විසඳුම් ක්‍රියාත්මක කළ හැකි ආකාර පිළිබඳව මහ බැංකුව ගවේෂණය කරනු ඇත. එවැනි නියාමන රාමුවක් භාවිතයට ගැනීම සහ සහායක මානව සම්පත් ප්‍රතිපත්ති අනුගමනය කිරීම තුළින් ඉදිරියේ දී මහ බැංකුවට වේගයෙන් විකාශනය වන තාක්‍ෂණය මත පදනම් වූ මූල්‍ය

නවෝත්පාදනයන් හා සමගාමීව ගමන් කිරීමට හැකිවන අතර, මෙමගින් මූල්‍ය පද්ධති ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකි වනු ඇත.

ඉදිරියේ දී, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB), නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC) සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (PSB) ඒකාබද්ධ කරමින් ස්ථාපනය කිරීමට යෝජිත ජාතික සංවර්ධන බැංකු සංස්ථාව (NDBC) පිහිටුවීම සඳහා මහ බැංකුව රජය සමඟ සමීපව කටයුතු කරමින් පහසුකම් සැලසීම සිදු කරනු ඇති අතර, එය ශ්‍රී ලංකාවේ සංවර්ධන බැංකුකරණයේ නව යුගයක් බිහි කරනු ඇත.

අනෙකුත් ව්‍යාපාරික අංශ සමඟ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය ද 2020 වසර තුළ දී සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දුන්නේය. ඍණාත්මක ණය වර්ධනය, ලාභදායීත්වය පහත වැටීම හා අක්‍රීය ණය අනුපාතිකය ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ කාර්යසාධනය 2020 වසර තුළ දී පිරිහීමට ලක් විය. කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ පනවන ලද විවිධ සීමාවන් හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් පහත වැටීම, මෙම අංශයේ මන්දගාමීත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය. දුර්වල මූල්‍ය තත්ත්වයන් සහිත සමාගම් නැවත නගා සිටුවිය හැකි ආකාරය සහ එම සමාගම්වල ශේෂ පත්‍රයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග හඳුන්වා දිය හැකි ආකාරය කෙරෙහි සැලකිලිමත් වෙමින් මහ බැංකුව විසින් ප්‍රධාන විචක්ෂණශීලී දර්ශක අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය අංශයේ දිගුකාලීන ස්ථායීතාවය සහතික කිරීම සඳහා අඛණ්ඩව දුර්වල කාර්යසාධනයක් පෙන්නුම් කළ මුදල් සමාගම්වල මූල්‍ය ව්‍යාපාර කටයුතු අත්හිටුවීමට හෝ සීමා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගය ගනු ලැබීය. තව ද, කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරවලට සහ පුද්ගලයන්ට සහාය වීම සඳහා, අවශ්‍ය නම්‍යශීලී බව සපයමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී.

කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරවලට සහ පුද්ගලයන්ට සහන සැපයීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධාන නිකුත් කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ණය

ගැනුම්කරුවන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සපයන ලදී. මීට අමතරව, දේශීයව එකලස් කරනු ලබන මෝටර් රථ සඳහා වටිනාකම මත ණය අනුපාතය සම්බන්ධව නිකුත් කර තිබූ විධාන සංශෝධනය කරන ලදී. මෙම අංශය සැලකිය යුතු පීඩනයකට ලක්ව ඇති බැවින්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වාගෙන යා යුතු ද්‍රවශීල වත්කම් සම්බන්ධයෙන් පවත්නා විධාන බලාත්මක වන දිනය තවදුරටත් දීර්ඝ කරන ලදී.

තැන්පතු ලබා ගන්නා බැංකු නොවන ශක්තිමත් මූල්‍ය ආයතන ඇති කිරීමේ දී මුහුණදෙන අභියෝග විසඳීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය. ගැටලුවට ලක් වූ ආයතනවල මූල්‍ය ශක්තිමත්භාවය සහතික කිරීමේ අරමුණින් යුතුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාකාරී රාමුව (Prompt Corrective Active Framework) සඳහා වන මාර්ගෝපදේශ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. මෙමගින් මූල්‍ය පද්ධතිය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය සහ තැන්පත්කරුවන්ගේ යහපත ආරක්ෂා කෙරෙනු ඇත. මෙම මාර්ගෝපදේශ 2022 වසරේ ජූලි මස සිට බලාත්මක වේ. ඇතැම් බලපත්‍රලාභී මුදල් සමාගම්වල පවත්නා ව්‍යාපාර ආකෘතීන් ශක්තිමත් කිරීම සඳහා ත්, අසාර්ථක වීම් වැළැක්වීම සඳහා ත්, නියාමන සහ අධීක්ෂණ රාමු කිහිපයක් ආරම්භ කරන ලදී.

බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය රජය, මහ බැංකුව සහ මහජනතාව විසින් හොඳින් හඳුනාගෙන ඇත. එබැවින්, ඉදිරියේ දී මෙම අංශය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම ජාතික ප්‍රමුඛතාවයක් ලෙස සලකා කටයුතු කරනු ඇත. මහ බැංකුව විසින් මැදි කාලීන ඒකාබද්ධ සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටින  අතර, ශක්තිමත් සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම්වලට රටේ ආර්ථික අවශ්‍යතාවයන්ට ඵලදායී ලෙස දායක වීමට එමගින් අවකාශ සැලසෙනු ඇත. පවත්නා නියාමන රාමුවට සිදු කිරීමට අපේක්ෂිත වෙනස්කම්වලින් ලැබෙන සහයෙන් මෙම අංශය මැදි කාලීනව තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

මේ අතර, නව  විශ්ලේෂණ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි දැනට පවත්නා ක්‍රමවේදය සමාලෝචනය කිරීම තුළින් මහ බැංකුවේ සාර්ව විචක්ෂණ නිරීක්ෂණ ක්‍රමවේදය

තවදුරටත් ශක්තිමත් සහ පුළුල් කෙරෙනු ඇත. සමස්ත ආර්ථිකයට ප්‍රතිලාභ ලබා දෙන ශක්තිමත් මූල්‍ය පද්ධතියක් සැකසීමේ අරමුණින් යුතුව, සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

2020 වසරේ දී, මහ බැංකුව කාල නිර්ණය කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් මත පදනම්ව තිරසාර මූල්‍යනයක් සඳහා වන ඉදිරි දැක්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගත්තේ ය. එම ඉදිරි දැක්ම යටතේ සාමූහික ප්‍රගතිය වේගවත් කිරීම සඳහා අන්තර් නියාමන කමිටුවක් පත් කර ඇත. අදාළ පාර්ශ්වකරුවන්ට තිරසාර මූල්‍යනය ප්‍රායෝගිකව සිදු කිරීමට හැකිවන අයුරින්, ජාත්‍යන්තර යහ භාවිතයන්ට අනුකූලව, 2021 වසරේ දී යෝග්‍ය වර්ගීකරණ ක්‍රමවේදයක් සකස් කරනු ඇත.

දැනට නියාමනයට ලක් නොවන මුදල් ණයට දීමේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් බලාත්මක කිරීම තුළින් මුදල් ණයට දෙන ආයතන හා සම්බන්ධව වඩා යහපත් සහ වඩා කාර්යක්ෂම නියාමන පරිසරයක් නිර්මාණය කිරීම අතිශයින්ම වැදගත් වේ. මේ සඳහා, මුදල් මණ්ඩලය විසින් ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත (Microfinance and Credit Regulatory Authority Act (MCRA)) සඳහා අනුමැතිය ලබා දී ඇත. මේ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ. බලාත්මක කිරීමෙන් පසුව මෙම පනත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ රටෙහි මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇත.

විශේෂයෙන් ම අඩු පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ, ඉහළ ප්‍රතිලාභ සඳහා බොහෝ විට ඉහළ අවදානමක් පවතින බැවින් විකාශනය වෙමින් පවතින මූල්‍ය පද්ධතිය තුළ සිටින සියලුම පාර්ශ්වකරුවන්ට වැදගත් කාර්යභාරයක් පැවරේ. එබැවින්, තැන්පත්කරුවන් ආයෝජන අවස්ථා තෝරා ගැනීමේ දී අවදානම් සහ ප්‍රතිලාභ අතර තුලනයක් පවත්වා ගැනීම පිළිබඳව සැමවිට ම සැලකිලිමත් විය යුතු අතර, මූල්‍ය ආයතන විසින් අවදානම් ගණනය කර තරගකාරී ලෙස ප්‍රතිලාභ ලබා දීම තුළින් මූල්‍ය පද්ධතියේ ඵලදායී බව සහ ශක්තිමත් බව ඇති කළ හැකි වේ. අනෙක් අතට, මූල්‍ය අංශය විශේෂයෙන් ම පාරිසරික තිරසාරභාවය හා තිරසාර සහ සැමට

ප්‍රතිලාභ ලබා දෙන සංවර්ධනය සඳහා වන දායකත්වය වැනි සාමාන්‍යයෙන් ව්‍යාපෘතිවල දී නොසලකා හරින ලද පැතිකඩයන් පිළිබඳව අවධානය යොමු කරමින්, එවන් ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් දිගුකාලීන දැක්මකින් යුතුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2020 වසර ඩිජිටල් ගනුදෙනු වසර ලෙස නම් කරන ලදී. එබැවින්, ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණ මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා වසර පුරා නොයෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. LANKAQR යනු මුළු රට ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ එවැනි එක් ක්‍රියාමාර්ගයක් වන අතර, ඒ සඳහා පාර්ශ්වකරුවන්ගෙන් විශාල පිළිගැනීමක් ලැබුණි. ඇත්ත වශයෙන් ම, ඩිජිටල් ගෙවීම් වේදිකා භාවිත කිරීම අතිශයින් ප්‍රයෝජනවත් බව වසංගත කාලය තුළ දී පැහැදිලි විය.

නව තාක්‍ෂණික ක්‍රමවේදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම තුළින් 2020 වසරේ දී ගෙවීම් හා පියවීම් අංශයෙහි මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකි විය. නියාමන රාමුව ශක්තිමත් කිරීම, ගනුදෙනුකරුවන්ගේ අරමුදල් සහ තොරතුරුවල ආරක්ෂාව සහතික කිරීම සහ ගෙවීම් හා පියවීම්වල පද්ධතීන්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම යනාදිය විශේෂ අවධානයක් යොමු වූ අංශ විය. ඒ අනුව, නව ව්‍යාපෘති දියත් කිරීම් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වේදිකාවක් සපයමින් මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශය (Fintech Regulatory Sandbox) ස්ථාපිත කරන ලදී. එසේම, බලපත්‍රලාභී වාණිජ බැංකු හා සහයෝගයෙන් යුතුව බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) පදනම් කරගත් ගනුදෙනුකරු හඳුනාගැනීමේ (Know-Your-Customer- KYC) ක්‍රියාවලිය ද ඒ සඳහා උනන්දුවක් දක්වන දායකයින් තිදෙනෙකු විසින් වැඩිදියුණු කරන ලද අතර, එය දැනට පරීක්ෂණ මට්ටමේ පවතී. මීට අමතරව, ප්‍රාග්ධන ප්‍රවාහයන් ආකර්ෂණය කර ගැනීමට හා රටවල් අතර සිදුවන වෙළඳාමට පහසුකම් සැලසෙන පරිදි ඊ වාණිජ්‍ය සක්‍රීය කර ගැනීමට හැකි වන පරිදි වෙනත් ආකාර ගෙවීම් යාන්ත්‍රණයක් වැඩි දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාව ද මහ බැංකුව ක්‍රියාකාරීව සොයා බලමින් සිටියි. ශ්‍රී ලංකාව තුළ විවෘත බැංකුකරණයක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව විමර්ශනය කෙරෙමින්

පවතී. ශ්‍රී ලාංකීය නේවාසිකයන් සඳහා සිදු කරන ගෙවීම් ලබා ගැනීමට පහසුකම් සැලසීමට මහ බැංකුව පේපැල් යෙදවුම් (PayPal) වැනි ජාත්‍යන්තර ගෙවීම් සේවා සපයන්නන් සමඟ දැනටමත් සාකච්ඡා ආරම්භ කර ඇති අතර, ඒ සම්බන්ධව ධනාත්මක ප්‍රතිඵල අපි නුදුරු අනාගතයේ දී බලාපොරොත්තු වෙමු. අනාගත ගෝලීය මූල්‍ය තාක්ෂණය අත්‍යවශයෙන් ම ඩිජිටල්කරණය වූවත් ශ්‍රී ලංකා මහ බැංකුව ඩිජිටල් මුදල් (Digital currencies) පිළිබඳ දේශීය හා විදේශීය පාර්ශ්වකරුවන් සමඟ තම විචාරණය, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණ තුළින් සහ දීර්ඝ කාලීන දෘෂ්ටි කෝණයකින් තවදුරටත් සිදු කෙරෙනු ඇත.

ශක්තිමත් නිරාකරණ රාමුවක් පැවතීම හිතකර මූල්‍ය පද්ධතියක අත්‍යවශ්‍ය අංගයකි. සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අරමුණින් ශක්තිමත් නිරාකරණ රාමුවක් සකස් කිරීමට මහ බැංකුව දැනටමත් පියවර ගෙන ඇත. මූල්‍ය ආයතන අසාර්ථකවීම් සිදු වුවහොත්, කඩිනම් හා කාර්යක්ෂම වන්දි ගෙවීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරිම සහතික කිරීම සඳහා අප දැනටමත් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි (Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme) රෙගුලාසි සංශෝධනය කිරීම ආරම්භ කර ඇත. යම් ලෙසකින් මූල්‍ය ආයතනයක් කිසියම් අසාර්ථකවීමක් වුවහොත් එමගින් වන කම්පන අනෙකුත් මූල්‍ය ආයතනවලට සම්ප්‍රේෂණය වීම සහ ආර්ථිකයේ මූර්ත අංශයට අවදානම් පැතිර යෑම වළක්වා ගැනීම සඳහා නිරාකරණ රාමුව යටතේ මහ බැංකුව අවශ්‍ය පියවර ගනු ඇත.

2020 වසරේ දී ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොළ මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් වූයේ දේශීය ප්‍රාග්ධන වෙළඳපොළින් සැලකිය යුතු විදේශ ආයෝජන ප්‍රමාණයක් පිටතට ගලා යාමයි. 2020 වසරේ පළමු මාස කිහිපය තුළ දී දේශීය ප්‍රාග්ධන වෙළඳපොළෙහි වැඩිම කොටස හිමි රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සැලකිය යුතු විදේශ ආයෝජන ප්‍රමාණයක් පිටතට ගලා යෑමක් වාර්තා විය. කොවිඩ්-19 වසංගතය විසින් ඇති කරන ලද අවිනිශ්චිතතා රැසක් සහිත පසුබිමක් තුළ, අනෙකුත් බොහෝ නැගී එන වෙළඳපොළ මෙන් ම ශ්‍රී ලංකා කොටස් වෙළඳපොළ ද 2020 වසරේ දී ඉහළ

විචලනයකට මුහුණ දුන්නේය. කෙසේ වෙතත්, වෙළඳපොළ දර්ශක සහ පිරිවැටුම ඉහළ යාමත් සමඟ කොළඹ කොටස් හුවමාරුව ආසියානු කලාපයේ හොඳින් ම ක්‍රියාත්මක වන වෙළඳපොළක් බවට පත්ව ඇත. අතීතයේ දී මෙන් ඉහළ පොලී අනුපාත සහිත පරිසරයක් රට තුළ තවදුරටත් පැවතිය නොහැකි බැවින්, ඉදිරියේ දී ප්‍රාග්ධන වෙළඳපොළවල් මගින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යාපාර සඳහා කොටස් ප්‍රාග්ධනය සහ වෙනත් ආකාරයේ මූල්‍යනයයන් සපයන අතර ම, ඉතිරි කරන්නන් සඳහා වඩා හොඳ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා වඩා සංවර්ධිත ප්‍රාග්ධන වෙළඳපොළවල් අත්‍යවශ්‍ය වේ.

ඉදිරියේ දී, ආර්ථිකය වේගයෙන් පිබිදෙනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හා සුරක්ෂිත කරගැනීමට ඇවැසි වෙනස්වීම් සඳහා අනුගත වීමට ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොළවල් සහ නියාමන ආයතන සූදානම් විය යුතු ය. 2021 වසරේ මැද භාගයේ දී වාර්තා ගත ලෙස වාණිජ හා මූල්‍ය වත්කම් ඉහළ නංවා ගැනීමට සැලසුම් කර ඇති කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපයේ වේගවත් සංවර්ධනය, මූල්‍ය අංශ වර්ධනයෙහි කාර්යසාධනය උත්ප්‍රේරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය සම්බන්ධයෙන් ගත් කළ, අදාළ පාර්ලිමේන්තු පනත මගින් වැඩි දියුණු කර ඇති පරිදි අවශ්‍ය කරන නියාමන රාමුව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව රජය සමඟ කටයුතු කරනු ඇත. වරාය නගරයේ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය ආවරණය වන පරිදි අපේක්ෂිත විශේෂ නීති සම්පාදනය කරමින් ජාතික මූල්‍ය අංශ නියාමන රාමුව බාධාවකින් තොරව සහයෝගයෙන් සිදු කිරීම මෙම ඒකාබද්ධ වැඩපිළිවෙළින් සහතික කෙරේ.

## 4. පුළුල් ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්ති

මේ දක්වා මා විසින් සාකච්ඡා කිරීමට යෙදුණේ මහ බැංකුවේ මූලික කාර්යයන් සහ ඒ හා සම්බන්ධ සැලසුම් හා ප්‍රතිපත්ති පිළිබඳවයි. මෙතැන් පටන් මා යොමුවන්නේ මහ බැංකුවේ සහායක සහ නියෝජිත කාර්යයන් වෙත අවධානය යොමු කිරීමටයි. මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට සහය වෙමින්, පුළුල් ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කරමින් මහ බැංකුව මෙම කාර්යයන්හි නිරත වේ.

### ව්‍යවහාර මුදල් කළමනාකරණය

ඔබ සැවොම දන්නා පරිදි, ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ කටයුතු කළමනාකරණය කිරීමේ පූර්ණ අයිතිය මහ බැංකුව සතු වේ. තාක්‍ෂණය මත පදනම් වූ නෝට්ටු හා කාසි භාවිත නොවන ගෙවීම් ක්‍රම භාවිත කිරීම සඳහා අපි දිගින් දිගටම පහසුකම් සපයන්නෙමු. කෙසේ වෙතත්, වසංගතයේ කාලපරිච්ඡේදය තුළදී මුදල් සඳහා ඉල්ලුම වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය. මෙවන් අර්බුදකාරී කාලවල දී ජනතාව විසින් ආරක්ෂණ චේතනාවෙන් වැඩි මුදල් ප්‍රමාණයක් රඳවා ගනු ලැබීමේ ප්‍රවණතාවය මෙමගින් පිළිබිඹු වේ.

වසංගත තත්ත්වය මධ්‍යයේ නෝට්ටු හා කාසි භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා රජයේ සෞඛ්‍ය හා ආරක්ෂක මාර්ගෝපදේශයන්ට අනුකූලව මුදල් හුවමාරු කවුළුව විවෘත කිරීමට අප කටයුතු කළ අතර, භාවිතයට නුසුදුසු මුදල් භාර ගැනීම ද අඛණ්ඩව සිදු කෙරිණි. නෝට්ටු හා කාසි සම්බන්ධ කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා අතිරික්ත මුදල් නෝට්ටු අතරින් නැවත භාවිතයට ගත හැකි මුදල් නෝට්ටු මහ බැංකුව වෙත යොමු කිරීමකින් තොරව බලපත්‍රලාභී වාණිජ බැංකු අතර හුවමාරු කර ගන්නා යාන්ත්‍රණය හඳුන්වා දෙන ලදී. නැවත භාවිතයට ගත හැකි තත්ත්වයේ මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු අතර හුවමාරුව පහසු කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් නුදුරේ දී හඳුන්වා දෙනු ඇත. තවද, හදිසි අවස්ථාවල දී භාවිත කිරීම සඳහා මුදල් තොග නඩත්තු කිරීම ශක්තිමත් කිරීම සඳහා මුදල් නෝට්ටු සහ කාසි තොගයෙන් කොටසක් මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ සිට

බස්නාහිර පළාතෙන් පිටත අලුතින් පිහිටුවන ලද අනිශ්චිත අවශ්‍යතා සඳහා වන මුදල් සුරක්ෂිතාගාර වෙත මාරු කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

2020 වසරේදී මහ බැංකුව සිය 70 වන සංවත්සරය සැමරුවේය. මෙම අවස්ථාව සනිටුහන් කිරීම සඳහා, රු. 20ක වටිනාකමින් යුතු, සංසරණය සඳහා නොයෙදවන සමරු කාසියක් නිකුත් කරන ලද අතර, සංසරණය සඳහා වන සමරු කාසියක් ළඟදීම නිකුත් කෙරෙනු ඇත. දැනට පවතින 11වන නෝට්ටු මාලාවේ කොටසක් ලෙස වැඩිදියුණු කරන ලද ආරක්ෂණ සළකුණු සහිත රු. 2,000ක වටිනාකමකින් යුතු නව මුදල් නෝට්ටුවක් 2021 වසරේදී හඳුන්වා දෙනු ඇත.

## රාජ්‍ය ණය කළමනාකරණය

මහ බැංකුව රජය වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කරයි. මෙම කාර්යයේ ව්‍යවස්ථාපිත වගකීම වනුයේ අවම පිරිවැයක් යටතේ රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විචක්ෂණශීලී ණය කළමනාකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමයි. මෙම කාර්යය තුළ මහ බැංකුව සාධාරණ අවදානම් මට්ටමකට පමණක් ඉඩ දිය යුතු අතර, මැදිකාලීනව ණයවල තිරසාර බව සහතික කළ යුතුය.

මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයේ අවධානය නොපියවා ඉතිරිව ඇති සමස්ත ණය ප්‍රමාණයෙන් විදේශ ව්‍යවහාර මුදලින් පවත්නා නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය සීමා කිරීම, විදේශ ව්‍යවහාර මුදලින් පවත්නා ණය ප්‍රමාණයෙහි කල්පිරීමේ සාමාන්‍ය කාලය වැඩි කිරීම සහ කෙටි කාලීන ණය කළමනාකරණය කිරීම කෙරෙහි අඛණ්ඩව යොමුව පවතී. අතිශය අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්වයන් තුළ, 2020 වසරේ දී ණය සේවාකරණය සියයට 100ක නිරවද්‍යතාවයක් සහිතව නියමිත පරිදි සිදු කරන ලදී. ඉදිරියේදී ද අපි අඛණ්ඩව එසේ කටයුතු කරන්නෙමු.

රජයේ නිකැළැල් ණය සේවාකරණ වාර්තාව ඉදිරියේ දී ද පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මුදල් මණ්ඩලය 2020 වසරේ පැවති අවසන් රැස්වීමේ දී විදේශීය ණය අධීක්ෂණය සඳහා ද්වි-ස්ථර කාර්ය සාධක බලකායක් පිහිටුවීය. මෙම කාර්ය සාධක

බලකාය මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් මෙහෙයවනු ලබන අතර, විදේශ සංචිතවල ප්‍රමාණවත්භාවයට අනුරූපව විදේශීය ණය ගතිකතාවයන් සමීපව අධීක්ෂණය කිරීම සහ අධිපතිතුමා වෙත විධිමත් නිර්දේශ නිරන්තරයෙන් ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වේ.

පෙර නොවූ විරූ ලෙස මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගයන්ගෙන් අනතුරුව, 2020 වසරේ මැයි මාසයේ සිට සියලු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා "පිළිගැනීමේ උපරිම ඵලදා අනුපාතය" ක්‍රමවේදය හඳුන්වා දුන් අතර, එය රජයේ සුරැකුම්පත් නිකුත්වල සාමාන්‍ය පිරිවැය ඉතිහාසයේ මෙතෙක් පැවති පහළම මට්ටම දක්වා අඩු වීමට හේතු විය. ණය පිරිවැය අවම කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපළ අවස්ථා උපයෝගී කර ගැනීමටත්, කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති ආරක්ෂණ ගොඩනංවා ගනිමින් රජයේ සුරැකුම්පත් සඳහා විචක්ෂණශීලි අවදානම් මට්ටමක් පවත්වා ගැනීමටත්, විචක්ෂණශීලි වගකීම් කළමනාකරණ ක්‍රියාවලියකට හැකි වනු ඇත.

රජයේ සුරැකුම්පත් සඳහා ප්‍රාථමික වෙන්දේසිකරුවන්ගේ සහභාගිත්වයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් වෙන්දේසි දින දර්ශනය කාර්තුමය පදනමින් අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. 2021 වසරේ සිට මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මාස හයක් හෝ ඊට වැඩි කාලයක් වෙන්දේසි දින දර්ශනය නිකුත් කරනු ඇත. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම සඳහා ඍජු නිකුත් කිරීමේ ක්‍රමවේදයක් මගින් පහසුකම් සපයන ලදී. ඉදිරියේ දී, මහ බැංකුව විසින් ස්ථාවර අනුපාත යටතේ මෙන් ම මුදල් වර්ග කිහිපයකින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කරනු ඇති අතර, එමගින් මූල්‍ය අංශයේ විදේශ මුදල් තැන්පතු වර්ධනය කර ගැනීමට පහසුකම් සැලසෙනු ඇත.

භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ දී නිවාඩු දින පිළිබඳ සැලකීමේ ක්‍රමවේදය භාණ්ඩාගාර බැඳුම්කර හා සම්බන්ධ ක්‍රමවේදයට අනුකූල කිරීම සඳහා ද විධිවිධාන ක්‍රියාත්මක වන අතර, දින 364 කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා නව ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක (ISIN) නිකුත් කිරීම සහ දින 91 සහ දින

182 කල්පිරීම් සහිත බිල්පත් කල් පිරීමට ඉතිරිව ඇති කාලය මත පදනම්ව නිකුත් කිරීම 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. අන්තර්ජාලය පදනම් කරගත් නව භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි ක්‍රමයක් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සෘජු නිකුත් කිරීමේ කවුළුවක් ක්‍රියාත්මක කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳව මේ වන විට අධ්‍යයනය කෙරෙමින් පවතී.

රජයේ සුරැකුම්පත් සඳහා පවත්නා තත්කාලීන දළ පියවුම් පද්ධතිය (Real-time Gross Settlement System) සහ මධ්‍යම තැන්පතු පද්ධතිය (Central Depository System) නවීකරණයට සමගාමීව, අවශ්‍ය නීතිමය රාමුව ද සමඟින් රජයේ සුරැකුම්පත් සහ දේශීය විදේශ විනිමය ගනුදෙනු සඳහා අති නවීන ඉලෙක්ට්‍රොනික වෙළඳ පද්ධතියක් (Electronic Trading Platform) සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරයක් (Central Counterparty Clearing House) පිහිටුවීමට මහ බැංකුව කඩිනමින් කටයුතු කරමින් සිටියි. මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරය ද අනාගතයේ දී අනෙකුත් වත්කම් වර්ග ආවරණය වන පරිදි පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාමාර්ග තුළින් රටේ මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ මෙහෙයුම් වැඩිදියුණු වනු ඇතැයි ද, ප්‍රතිපාර්ශ්වික අවදානම අවම වනු ඇතැයි ද, වෙළඳපොළ ද්‍රවශීලතාවය, මිල විනිවිදභාවය සහ ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු වනු ඇතැයි ද, එමගින් අඩු පිරිවැය යටතේ ණය ලබාගැනීම සඳහා රජයට පහසුකම් සැලසෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

### සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

මැදි කාලයේ සිට දිගු කාලය දක්වා යොමුවන විවිධාංගීකරණය වූ ආයෝජන උපායමාර්ගයකට පහසුකම් සැලසීමේ අරමුණ සහිතව, මහ බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල (EPF) කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කරයි. සෑම විටම අභිප්‍රාය වූයේ ආයෝජන මාර්ගෝපදේශ දැඩිව අනුගමනය කරන අතර ම, සාමාජිකයින්ට උපරිම ප්‍රතිලාභ ලබා දීමයි. ඒ අනුව, රජයේ සුරැකුම්පත් හා කොටස් ගනුදෙනුවල ප්‍රාථමික හා ද්විතීයික

වෙළඳපොළ ආයෝජනවල නිරතවී ඇති අතර, ආයතනික ණයකරවල ද ආයෝජනය කර ඇත.

ඉදිරියේදී, නවතම වෙළඳපළ වර්ධනයට අනුකූල වන පරිදි ආයෝජන මාර්ගෝපදේශ සංශෝධනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. එමගින් අරමුණු කරනුයේ පවත්නා අභ්‍යන්තර පාලන පරිසරය ශක්තිමත් කරමින් වඩාත් විචක්ෂණශීලී ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලියකට පහසුකම් සැපයීමයි. වර්තමාන අඩු පොලී අනුපාත වාතාවරණය යටතේ සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන විවිධාංගීකරණය කිරීම සඳහා විකල්ප ආයෝජන මාර්ග පිළිබඳව අවධානය යොමු කරන අතර ම, වෙළඳපොළ තුළ පවත්නා පොලී අනුපාතයන්ට සාපේක්ෂව ඉහළ අවදානම්-ගැලපුම් සහිත ප්‍රතිලාභ අනුපාතයක් උත්පාදනය කිරීම සඳහා එම ආයෝජනයන් ප්‍රතිතුලනය කිරීමට අපි අපේක්ෂා කරමු.

තවද, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ පාර්ශවකරුවන්ට ප්‍රශස්ත සේවාවක් සැපයීම සඳහා, 2021 වසරේ දී දක්ෂ උපදේශකයින්ගේ සහාය ඇතිව ව්‍යාපාර ක්‍රියාවලිය නැවත මෙහෙයවීමටත්, එමගින් සාමාජික කේන්ද්‍රීය ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ විසඳුමක් ඇති කිරීමටත්, ආයෝජන හා ගිණුම්කරණ ඒකකයන් ක්‍රියාත්මක කිරීමටත් අපි සැලසුම් කරමු.

## විදේශ විනිමය කළමනාකරණය

කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි සිදු වූ ගැටළු පාලනය කිරීම සඳහා විනිමය අනුපාතය ස්ථාවර කිරීම සහ රටෙහි විදේශ විනිමය සංචිත තත්ත්වය ශක්තිමත් කිරීමට ඇතැම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයන් සහ ප්‍රාග්ධන ගිණුම හා සම්බන්ධ ඇතැම් ගෙවීම් සීමා කිරීම වැනි නියාමන ක්‍රියාමාර්ග ගණනාවක් අපි ක්‍රියාවට නැංවූයෙමු.

රට වෙතට වන ප්‍රේෂණ ලැබීම් දිරිගැන්වීමේ අරමුණින්, අලුතින් විදේශ විනිමය ප්‍රේෂණය කරන විට විවෘත කළ හැකි විශේෂ තැන්පතු ගිණුම් (SDA) නමින් ගිණුම්

ක්‍රමයක් හඳුන්වා දුන් අතර, එය සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ළඟාකර ගැනීම සඳහා උපකාරී වී තිබේ.

විදේශ විනිමය ලැබීම් අඩු වීමත් සමඟ, ව්‍යාපාර විදේශ මුදල් ගිණුම් (BFCA) හිමි විදේශ විනිමය උපයන්නන් සහ පුද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCA) හිමි විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, අවසාන පියවරක් ලෙස, ණය ගැනුම්කරුවන්ට විදේශ මුදලින් ලබා දී ඇති ණය, කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ආපසු අයකර ගැනීමට බලයලත් වෙළෙඳුන්ට අවසර දෙන ලදී.

විදේශීය අංශයේ වර්ධනයන් පවත්වා ගැනීම සඳහා, ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු මත වූ ප්‍රාග්ධන ගෙවීම් අත්හිටුවීම සඳහා නිකුත් කර ඇති නියෝගයේ වලංගු කාලය 2021 ජනවාරි මාසයේ සිට තවත් මාස හයක් දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.

තවද, වෙළඳපළ තුළ විදේශ විනිමය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරනු වස්, සුදුසුකම් ලත් පුද්ගලයින්ට පහසුකම් සැලසීම තුළින් විදේශ විනිමය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් සංශෝධිත නිර්ණායක හඳුන්වා දීමට අපි අපේක්ෂා කරමු. රටවල් දෙකක් අතර සිදුවන විදේශ විනිමය ගනුදෙනු සඳහා තවදුරටත් පහසුකම් සලසමින් එම ගනුදෙනු සරල කරමින්, පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන, විදේශ විනිමය පනත (FEA)ට යටත්ව, සංශෝධිත රෙගුලාසි සහ උපදෙස් නිකුත් කිරීමට නියමිත ය.

විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ සරල කිරීම සඳහා ඉදිරියේ දී විදේශ විනිමය කළමනාකරණ ක්‍රමවේදය සමාලෝචනය කෙරෙනු ඇත. අසාධාරණ ආකාරයට ශ්‍රී ලංකා ආර්ථිකයෙන් විදේශ විනිමය ඉවතට යන ඕනෑම මාර්ගයක් සහ පුද්ගලයන්ගේ හා සමාගම්වල සමපේක්ෂණ ක්‍රියා හේතුවෙන් දේශීය සම්පත්වල ඕනෑම පිටතට ගලා යෑමක් මෙමගින් වළක්වා ගත හැකි ය.

## මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් 2019 වසරේ දී ශ්‍රී ලංකාව අසාදු ලේඛනයෙන් හෙවත් "අළු ලැයිස්තුවෙන්" ඉවත් කිරීමෙන් පසුව, 2020 වසරේ මැයි මාසයේ දී යුරෝපා කොමිසම විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ (AML/CFT) ක්‍රියාවලියේ උපායමාර්ගික අඩුලුහුඩුකම් පැවති, අධි අවදානම් සහිත තෙවන කාණ්ඩයේ රටවල ලැයිස්තුවෙන් ශ්‍රී ලංකාව ඉවත් කරන ලදී. ජාතික සම්බන්ධීකරණ කමිටුවේ මගපෙන්වීම යටතේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ විෂයට සම්බන්ධ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම සහ එම ප්‍රතිපත්ති රාමුව සම්බන්ධයෙන් පැවති ගැටලු විසඳීම සඳහා පාර්ශ්වකරුවන් හා කැබිනට් අනුමැතිය ලද ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධීකරණය කිරීම ද අපි සිදු කළෙමු.

නියමයන්, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නියමිත වෙලාවට නිකුත් කිරීම මගින් මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් අධීක්ෂණය කිරීමේ කාර්යභාරය මෙහෙයවනු ලැබුණි. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අනුකූලවීම ශක්තිමත් කිරීම සඳහා, අපි 2020 වසරේ දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා හා සම්බන්ධ වගකීම් කෙරෙහි අවධානය යොමු කරමින් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කළෙමු. තව ද, වසංගත තත්ත්වය සමඟ ඇති විය හැකි මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් පිළිබඳව සුපරීක්ෂාකාරීත්වය ඉහළ නංවන ලෙස උපදෙස් දෙමින් සියලුම මූල්‍ය ආයතනවලට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සම්මතයන් සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවලට අනුකූල වන බවට අප විසින් තහවුරු කරනු ලැබ ඇත.

2020 වසරේ දී, බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ජාතික බුද්ධි අංශ ප්‍රධානී සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර, ඒ සමඟ මූල්‍ය බුද්ධි ඒකකය විසින් දේශීය ආයතන සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 12ක්

දක්වා ඉහළ ගියේය. තව ද, අදාළ ආයතන වෙත ගොස් සිදු කරන අධීක්ෂණ මෙන් ම අදාළ පාර්ශ්වයන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම ද අඛණ්ඩව සිදු කළ අතර, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ ඒ යටතේ නිකුත් කර ඇති නීති රීතිවලට අනුකූල නොවීම් වාර්තා වූ අවස්ථාවල දඩ මුදල් ද නියම කළෙමු.

ඉදිරියේ දී, ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්තියට අනුව තනි තනි වශයෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයුම් මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. තව ද, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව 2021 වසරේ දී සියලු අදාළ පාර්ශවකරුවන්ගේ එකමුතුවෙන් යාවත්කාලීන කරනු ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා අදාළ නීති සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ද අපි අපේක්ෂා කරමු. තවද, වාර්තා කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ විශ්ලේෂණ හැකියාවන් වැඩි කිරීම සඳහා "goAML" මංගත වාර්තාකරණ සහ විශ්ලේෂණ පද්ධතිය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. ඒ හා සමඟ ම, නිපුණතා අධිකාරිය විසින් ප්‍රාගුණන මූල්‍ය ණය (proliferation financing) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳව පවතින එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ සම්මුතීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාවලියට ද අපි පහසුකම් සපයන්නෙමු.

## ප්‍රාදේශීය සංවර්ධනය

මූල්‍ය අන්තර්ගතභාවය සහිත ස්ථාවර මූල්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කරනු වස් නිරන්තරයෙන් සිදු කරනු ලබන කටයුතුවලට අමතරව, මහ බැංකුව කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර නගාසිටුවමින් ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම සඳහා රජය සමඟ එක්ව මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කළේ ය. කොවිඩ්-19

වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා ඉහළ සහනදායී කොන්දේසි මත කාරක ප්‍රාග්ධන ණය ලබාදීම සඳහා "සෞභාග්‍යා" කොවිඩ්-19 පුනරුද ණය යෝජනා ක්‍රමය ම අදියර තුනකින් ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ මහ බැංකුව විසින් බලපෑමට ලක්වූ ව්‍යවසායන් 62,000කට පමණ රුපියල් බිලියන 180ක පමණ ණය අනුමත කරන ලදී. අවශ්‍යතා සහිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සපයන ණය පුළුල් කිරීම සඳහා ණය ඇපකර සැපයීම සහ පොලී සහනාධාර වැනි වෙනත් යෝජනා ක්‍රම කිහිපයක් ද ක්‍රියාත්මක කෙරිණි. අපගේ ඉලක්කය වූයේ නිෂ්පාදන ආර්ථිකයේ කොඳු නාරටිය වන ආර්ථික වර්ධනය වෙත නැඹුරු වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීමයි.

මූල්‍ය සාක්ෂරතාවය හා ධාරිතා වර්ධන වැඩසටහන් සහ විවිධ වෙළඳපොළවල පවතින තොරතුරු අසමමිතිකතාවලට පිළියම් යෙදීම ඔස්සේ මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සඳහා අපි දිගින් දිගටම උත්සාහ කළෙමු. තැන්පතුකරුවන් අවදානම් පිළිබඳ නිසි සැලකිල්ලකින් තොරව ඉහළ ප්‍රතිලාභ ලබාගැනීමට පෙළඹීම වැනි ගැටලු සඳහා අඩු මූල්‍ය සාක්ෂරතාවය හේතු වී ඇත. දැරිය හැකි හා තිරසාර ලෙස භාවිතයට ගත හැකි, වෙළඳපොළ තුළ ඇති ගුණාත්මකභාවයෙන් යුතු මූල්‍ය උපකරණවල භාවිතය හා ලබා ගැනීමට ඇති හැකියාව ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික ක්‍රමෝපාය 2021 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. තවද, ජාතික මූල්‍ය අන්තර්ගතභාව පිළිබඳ කවුන්සිලය සහ ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ කළමනාකරණ කමිටුව පිහිටුවීම ඉදිරි කාල සීමාව තුළ ප්‍රධානත ම ප්‍රමුඛතා ලෙස පවතිනු ඇත. තවද, ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම, මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම, විධිමත් මූල්‍ය අංශයේ සහය ලබාදීම සහ ග්‍රාමීය ප්‍රජාව අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් ම සැලසුම් කර ඇත. අඩු පහසුකම් සහිත ජනතාවගේ ජීවනෝපාය නංවාලීම කෙරෙහි අවධානය යොමු කරන අතරතුර, සෞඛ්‍ය සම්පන්න ජීවන තත්ත්වයන් නංවාලීම සඳහා පරිසර හිතකාමී හරිත ගම්මාන පරිසරයක් ප්‍රවර්ධනය කිරීමට ද අපි සැලසුම් කරමු.

## මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා

මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන සම්බන්ධයෙන් මහ බැංකුව වෙත යොමු කෙරෙන සියලුම බාහිර පැමිණිලි සහ දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බාහිර පාර්ශ්වයන්ට සම්බන්ධ විය හැකි සබඳතා මධ්‍යස්ථානයක් වශයෙන් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඇත. එමගින් මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ නියාමන ක්‍රියාමාර්ග ජනතාවට ප්‍රතිලාභ සැලසෙන ආකාරයට බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇත. මෙම නව දෙපාර්තමේන්තුව, මූල්‍ය වෙළඳපොළ හැසිරීම සහ වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා කඩිනමින් සම්බන්ධ වීමට හැකි වන පරිදි එහි විෂය පථය යටතේ ඇති ආයතන ආවරණය වන පරිදි පුළුල් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් සකස් කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් සිටියි. ඉදිරියේ දී නව සම්බන්ධතා මධ්‍යස්ථානයක් (Contact Centre) පිහිටුවීමට නියමිත අතර, එමගින් මූල්‍ය පාරිභෝගිකයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් කාර්යක්ෂම ලෙස සිදු කිරීමට පහසුකම් සැලසෙනු ඇත. තවද, සියලුම මූල්‍ය ආයතන ආවරණය කෙරෙන පරිදි නව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ පනතක් හඳුන්වා දීමට අපේක්ෂා කරන අතර, මූල්‍ය ක්ෂේත්‍රයේ සියලු පාර්ශවකරුවන් ආවරණය වන පරිදි ස්වාධීන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමට ද ඉදිරි කාලය තුළදී පියවර ගනු ඇත.

## 05. සමාප්ති සටහන

නෝනාවරුනි, මහත්වරුනි,

මාගේ දීර්ඝ කථාවේ කෙටි සාරාංශයකිනුත්, අදාළ සියලු පාර්ශ්වහට කෘතවේදීත්වය පළකිරීමෙනුත් මාගේ කථාව අවසන් කිරීමට කැමැත්තෙමි.

ආරම්භයේ සඳහන් කළ පරිදි, 2020 වසර තුළ දී ශ්‍රී ලංකාවට තියුණු අවදානම්වලට මුහුණ දීමට සිදු විය. නමුත්, රජයේ සහ මහ බැංකුවේ විචක්ෂණශීලී ක්‍රියාමාර්ග නිසා එම අවදානම්වල බලපෑම විශාල ලෙස මැඩපවත්වා ගෙන තිබේ. මෙතෙක් දියත් කර ඇති ප්‍රතිපත්තිමය හා නියාමන ක්‍රියාමාර්ග, ආර්ථිකය මත හා ජනතාවගේ සුභසිද්ධිය කෙරෙහි ඇතිවූ විවිධාකාර කම්පනවල පීඩාකාරී බලපෑම යටපත් කිරීමට උපකාරී වී ඇත. එනමුත්, ගෝලීය ව්‍යාපාර චක්‍රයේ සහ අනෙකුත් කම්පනයන්හි බලපෑම විශාල වශයෙන් අවදානම් හා අවිනිශ්චිත භාවයන්ගෙන් යුක්ත වීම හේතුවෙන්, සාර්ව ආර්ථිකය හා මූල්‍ය පද්ධතිය මත ඇතිවිය හැකි පීඩනයන් සම්බන්ධයෙන් අප අඛණ්ඩව ම සුපරීක්ෂාකාරී විය යුතුය. තවද, වසංගතය මගින් ඇතිකර ඇති අභියෝග ජය ගැනීම රජයට සහ මහ බැංකුවට පමණක් කළ හැක්කක් නොවේ. ඒ සඳහා ආර්ථිකයට සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගාත්මක ප්‍රවේශයක් අවශ්‍ය වේ. එවන් සහයෝගයක් සමඟ පූර්වෝපායික තීරණ ගැනීමත්, නිසි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දියත් කිරීමත් තුළින් පමණක් ඉදිරියේ දී ඇති විය හැකි අභියෝග හා අවිනිශ්චිතතාවයන් මැඩලමින් මූර්ත ආර්ථිකයත් මූල්‍ය පද්ධතියත් නිසි මාර්ගයේ හසුරුවාලීමට අපට හැකි වනු ඇත. මහ බැංකුව, රටේ සම්පත්වල ඵලදායි උපයෝජනය දිරිමත් කිරීම පිණිස, ආර්ථික හා මිල ස්ථායීතාවයත් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයත් සුරැකීම යන සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අඛණ්ඩව කැපවී සිටියි. එමගින් මැදි කාලයේ දී, තිරසාර හා සැමට සාධාරණ ආර්ථික වර්ධනයක් උදා කර ගැනීමට අවශ්‍ය සමබර සාර්ව ආර්ථික වාතාවරණයක් ගොඩනැංවීමට උපකාරී වේ. ඩිජිටල් අන්තර්ගතභාවයෙන් යුතු, තාක්ෂණයෙන් බල ගැන්වූ හා පරිසර හිතකාමී, තිරසාර ඉහළ වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා මැදි කාලයෙන් ඔබ්බට සිතා, දීර්ඝ කාලීන සැලසුම් සකස් කිරීමට කොරෝනා වසංගතය

හේතුවෙන් ඇති වී ඇති මෙම තත්ත්වයන් අප විසින් අවස්ථා ලෙස ප්‍රයෝජනයට ගත යුතු අතර, එමගින් ශ්‍රී ලංකාවේ අනාගත පරම්පරාවන් හට ඉහළ මට්ටමේ ආර්ථික ස්වාධීනත්වයක්, සෞභාග්‍යයක් හා අසිරියක් දායක කෙරෙනු ඇත. පශ්චාත් වසංගත ප්‍රතිපත්ති සැකසීමේ දී තිරසාර සංවර්ධන අරමුණු කේන්ද්‍රස්ථානය කර ගත යුතු බවට කොවිඩ්-19 වසංගතය සියලු ජන කොටස්වලට විශාල පණිවුඩයක් ලබා දී ඇති අතර, අප සැමගේ සාමූහික ඉලක්කය වන සෞභාග්‍යය ළඟා කර ගැනීමේ දී මහ බැංකුව රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සක්‍රීය කාර්යභාරයක් ඉටු කිරීමට කැපවීමෙන් කටයුතු කරනු ඇත. මෙම පෙර දැක්මෙන් එළිදක්වා ඇති අනාගත ප්‍රතිපත්තිමය දිශාවන් හා ක්‍රියාමාර්ගයන් සියලු පාර්ශ්වයන් හට තම ක්‍රියාකාරකම් මැදි කාලීනව හා ඉන් ඔබ්බට දිවෙන පරිදි, ආර්ථික ප්‍රතිපත්ති සැලැස්මට අනුකූලව සකසා ගැනීම සඳහා මාර්ගෝපදේශයක් වේ යැයි අපි විශ්වාස කරන්නෙමු.

මාගේ කතාව අවසන් කිරීමට පෙර, මහබැංකුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා දායක වූ සහ සහාය ලබාදුන් පුද්ගලයින් කිහිපදෙනෙකුට මාගේ අවංක කෘතවේදීත්වය පළකිරීමටත්, ඔවුන් අගය කිරීමටත් අවස්ථාවක් ලබා ගැනීමට මම අදහස් කරමි. විශේෂයෙන් ම රජය සහ මහ බැංකුව අතර සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා සෑම උත්සාහයක්ම දරමින් නායකත්වය, මග පෙන්වීම සහ සහයෝගය ලබාදීම පිළිබඳව පළමුවෙන් ම සහ ප්‍රධාන වශයෙන්, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සහ ගරු අග්‍රාමාත්‍ය හා මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාට අතිශයින් කෘතවේදී වෙමි. එසේ ම මහ බැංකුවේ වැඩකටයුතු සඳහා ඉමහත් සහයෝගයක් ලබා දීම පිළිබඳව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය, ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාට, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ගරු ෂෙහාන් සේමසිංහ මැතිතුමාට, සහ ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාට ද මාගේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

විශේෂයෙන් ම, මෙම අභියෝගාත්මක කාලයන් තුළදී, මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහයෝගය සහ හරවත් සාකච්ඡා හා අදහස් මම බෙහෙවින් අගය කරමි. භාණ්ඩාගාර ලේකම් සහ නිල තනතුර අනුව මුදල් මණ්ඩල සාමාජික එස්.ආර්.ආටිගල සහ මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජිකයින් වන ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන, ආචාර්ය රාණි ජයමහ සහ සමන්ත කුමාරසිංහ යන මහත්ම මහත්මීන්ගේ සෘජු සහයෝගය තීරණ ගැනීමේදී වැදගත් සහ ප්‍රයෝජනවත් වූ අතර, ඒ පිළිබඳව මාගේ ප්‍රණාමය පුදකර සිටිමි. තවද, 2020 වසරේ මුල් භාගයේ දී මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් ලෙස කටයුතු කළ ක්‍රිෂාන්ත පෙරේරා, නිහාල් ෆොන්සේකා සහ ආචාර්ය දුෂ්නි වීරකෝන් යන මහත්ම මහත්මීන්ට ද, ඔවුන්ගේ සේවා කාලය තුළ මුදල් මණ්ඩලයට ලබා දුන් දායකත්වය පිළිබඳව ස්තුති කළ යුතුය. ප්‍රතිස්ථාපනය කරන ලද මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශන කමිටුවල සභාපතිවරුන්ට සහ සාමාජිකයන්ට මෙන් ම, මහ බැංකුවේ අනෙකුත් උපදේශක කමිටුවල සාමාජිකයින්ට ඔවුන් ලබා දෙන දායකත්වය වෙනුවෙන් මාගේ ස්තුතිය හිමි වේ. බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල සභාපතිවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහයෝගය සහ අනෙකුත් නියාමන ආයතනවල හා රාජ්‍ය ආයතනවල සහයෝගය ද කෘතවේදීව සිහිපත් කරමි.

උසස් මට්ටමේ වෘත්තීය උපදෙස් හා නිර්දේශ ලබා දෙමින් දක්වන සහයෝගය සහ දායකත්වය පිළිබඳව නියෝජ්‍ය අධිපතිවරුන් වන කේ.එම්.එම්. සිරිවර්ධන මහතාට, ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මහත්මියට සහ එන්.ඩබ්.ජී.ආර්.ඩී නානායක්කාර මහතාට මම ස්තුතිවන්ත වෙමි. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා සහ නියෝජ්‍ය අධිපති එච්.ඒ. කරුණාරත්න මහතා විසින් සිදුකළ සේවය ද අගය කිරීමට කැමැත්තෙමි. සහකාර අධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ද, විශේෂයෙන් ම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා ගත් උත්සාහ වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා ඇතුළු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ස්තුතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එදිනෙදා රාජකාරි කටයුතු කරගෙන යෑමේදී සහයෝගය දක්වන අධිපති ලේකම් කාර්යාලයේ මාගේ කාර්ය

මණ්ඩලය වෙත ද මාගේ ස්තුතිය පිරිනමමි. අභියෝගාත්මක කාලසීමාවලදී පවා ඉමහත් උනන්දුවෙන් සහ උද්යෝගයෙන්, අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වෙමින් ජාතිය වෙනුවෙන් හරවත් දායකත්වයක් ලබා දීමේ කර්තව්‍යය ඉටුකරන මහ බැංකු කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාට මාගේ කෘතවේදීත්වය පුද කිරීමට කැමැත්තෙමි.

මාගේ කථාව අවසාන කරන මේ අවස්ථාවේදී ද, අප මේ ගත කරන්නේ අසීරු හා අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් වන බව නැවත සඳහන් කළ යුතු අතර, එවන් කාලවල අපක්ෂපාතීව සමස්තයක් වශයෙන් ආර්ථිකය පිළිබඳ පොදු විශ්වාසය වැඩි දියුණු කිරීමට විශේෂ උත්සාහයක් ගත යුතු බව ද නැවත අවධාරණය කළ යුතුය. පීඩාකාරී අවස්ථාවන් ජය ගැනීම සඳහා සාමූහික ප්‍රයත්නයන් ගැනීම සහ අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් තිරසාර වර්ධන ප්‍රවණතාවක් අත්විඳීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇති බව මාගේ විශ්වාසයයි. ඇමෙරිකා එක්සත් ජනපද ඉතිහාසයේ කීර්තිමත් ජනාධිපතිවරයෙකු වන තියෝඩෝර් රූස්වෙල්ට් වරක් ප්‍රකාශ කළ පරිදි, "තීරණයක් ගත යුතු ඕනෑම අවස්ථාවක ඔබට කළ හැකි හොඳ ම දෙය නිවැරදි දෙය කිරීමයි, අනෙක් හොඳම දෙය වැරදි දෙය කිරීමයි, ඔබට කළ හැකි නරක ම දෙය කිසිවක් නොකර සිටීමයි". අභියෝගාත්මක කාලපරිච්ඡේදවල දී දරාගැනීමේ හැකියාව වර්ධනය කර ආපදාවන් ජයගැනීම සඳහා අතපසුවීම් මග හරවා ගනු වස් ප්‍රවේශම් සහගතව තීරණ ගත යුතු අතර, එම තීරණ ක්‍රියාත්මක කිරීම ද අත්‍යවශ්‍ය බව මම විශ්වාස කරමි. මුදල් හා මූල්‍ය අංශයන් සම්බන්ධයෙන් එළිදැක්වූ ප්‍රතිපත්ති සැලසුම් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට ආර්ථිකය පිළිබඳ දිගුකාලීන දැක්මක් ඇතිව, ඒ අනුව කටයුතු කිරීමට සුදුසු වාතාවරණයක් සකසා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.

ඔබ සැමට ස්තූතියි. එසේ ම, 2021 නව වසර සතුට සහ සෞභාග්‍යය සපිරි වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.